මිනිස් ජාවාරම් කටයුතුවල සිදුවන මුදල් ජාවාරම් සොයා ගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති මාර්ගෝපදේශය

මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ

බාලි ක්‍රියාවලිය

මිනිස් ජාවාරම් කටයුතුවලදී මූල්‍ය විමර්ශන මෙවලම් සම්බන්ධයෙන් වෘත්තීකයන් හට හැඳින්වීමේ මාර්ගෝපදේශයක්

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය, ජාතීන් අතර සංවිධානයවූ අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය (සංවිධානයවූ අපරාධ ප්‍රඥාප්තිය) සහ එහි ඌනපූරක ප්‍රොටෝකෝල දෙක වන, ගොඩබිමෙන්, මුහුදින් සහ ගුවනින් සංක්‍රමණිකයන්ව මිනිස් ජාවාරම් කිරීමට එරෙහි ප්‍රොටෝකෝලය, සහ විශේෂයෙන් කාන්තාවන් සහ දරුවන්ව මිනිස් ජාවාරම් කිරීම වැළැක්වීම, යටපත් කිරීම, සහ දඬුවම් කිරීමට අදාල ප්‍රොටෝකෝලය ඇතුළු දැනට අත්සන් කර නැති සහ / හෝ සම්මත කර ඇති සියළුම බාලි ක්‍රියාවලි රටවල් මගින් භාවිතා කල හැකිය. මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයේ ඇති වචන හැකිතාක් දුරට ජාත්‍යන්තර සම්මුති තුන හා අනුකූලවේ. කෙසේවුවද, පරිවර්තනය කිරීමේ අරමුණු වෙනුවෙන්, මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයේ භාවිතා කර ඇති නාමාවලිය සම්බන්ධයෙන් ප්‍රඥාප්තිය සහ එයට ඇති ප්‍රොටෝකෝල දෙක තීරණාත්මක ලෙස සැලකිල්ලට ගත යුතුය.



බාලි ක්‍රියාවලිය

මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ (බාලි ක්‍රියාවලිය) සම්බන්ධ බාලි ක්‍රියාවලිය ස්ථාපනය කරන ලද්දේ 2002 වසරේ වන අතර සාමාජික රටවල් සහ සංවිධාන 45 කින් සමන්විත ඕස්ට්‍රේලියානු රජය සහ ඉන්දුනීසියාව සම සභාපතිත්වය දරණ ස්වේච්ඡා සහ බැඳීම් ඇති නොකරන කලාපීය උපදේශාත්මක ක්‍රියාවලියකි.

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය සම්බන්ධ විමසීම් යොමුකල යුත්තේ බාලි ක්‍රියාවලියේ කලාපීය උපකාරක කාර්යාලය (Regional Support Office (RSO) වෙත පහත ආකාරයටවේ:

ඊමේල්: info@rso.baliprocess.net
වෙබ් අඩවිය: www.baliprocess.net/regional-support-office
ප්‍රකාශයට පත්කලේ 2018 ජූලි මාසයේදීය.

ග්‍රැෆික් මෝස්තර ඕස්ට්‍රේලියානු රජය මගිනි
ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

ස්තූතිය

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය වර්ධනය කලේ බාලි ක්‍රියාවලි සාමාජිකයන් මගින් වන අතර නායකත්වය ලබා දුන්නේ පහත සාමාජිකයන්ගෙන් සමන්විත බාලි ක්‍රියාවලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කමිටුව මගිනි:

යුසුෆිඩිලි අධ්‍යක්සානා,
ජාතීන් අතර සිදුවන වත්කම් ආපසු ලබා ගැනීමේ නියෝජ්‍ය ප්‍රධානියා II
වත්කම් ආපසු ලබා ගැනීමේ මධ්‍යස්ථානය (පී.පී.ඒ.), නීතිපති කාර්යාලය
ඉන්දුනීසියාව (සම සභාපති)

Australian Government
Department of Home Affairs

කීරාන් බට්ලර්
උපදේශක (නීති), ජාතීන් අතර අපරාධ අංශය,
ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, ඕස්ට්‍රේලියාව (සම සභාපති)

එම්. ඩී. මොස්ලම් අලි පී. පී. එම්. (නීති මඩුල්ල),
අතිරේක පොලිස් අධිකාරී, විශේෂ අපරාධ (පොලිස් මූලස්ථානය)
බංගලාදේශ පොලීසිය, බංගලාදේශය

මාරියා රෝසනි ෆැන්ගෝ
විශේෂ සහායක,
සංක්‍රමණ සේවකයන්ගේ උප ලේකම් කාර්යාලය,
විදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, පිලිපීනය

හේසල් ජෝයි පැනොංග්
නීති නිලධාරී,
සංක්‍රමණ සේවකයන්ගේ උප ලේකම් කාර්යාලය,
විදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, පිලිපීනය

කොන්ට්චා ඩඔරුඅන්ග්,
නඩු පැවරීමේ අංශයේ අධ්‍යක්ෂක
මුදල් විශුද්ධිකරණයට එරෙහි කාර්යාලය, තායිලන්තය

සිරියුට් විවේක්,
ජ්‍යෙෂ්ඨ විමර්ශක, ජාත්‍යන්තර සහයෝගීතා අංශය
මුදල් විශුද්ධිකරණයට එරෙහි කාර්යාලය, තායිලන්තය

UNODC
United Nations Office on Drugs and Crime

ක්‍රිස් බාට්
මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි උපදේශක
මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය

Australian Government
Department of Home Affairs

මයිකල් පෙට්,
නීති බලාත්මක උපදේශක,
මුදල් විශුද්ධිකරණයට එරෙහි උපකාර කණ්ඩායම
ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, ඕස්ට්‍රේලියාව

Australian Government
Department of Home Affairs

රෙබෙකා මිල්
සහකාර අධ්‍යක්ෂ,
මිනිස් ජාවාරම් සහ මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සම්බන්ධ අංශය,
ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, ඕස්ට්‍රේලියාව

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය සම්බන්ධ විමසීම් යොමුකල යුත්තේ **bali.process.tipwg@homeaffairs.gov.au** වෙතය.

පෙරවදන

2002 වර්ෂය ආරම්භයේ සිටම, මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය මගින් මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් අතර සිදුවන අපරාධවලින් ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධ කලාපීය දැනුවත්කම වැඩිවී ඇති අතර, එවාට ප්‍රතිචාර වශයෙන් උපාය මර්ග සහ ප්‍රායෝගික සහයෝගීතාවය වර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුවී ඇත. ඉන්දුනීසියාවේ සහ ඕස්ට්‍රේලියාවේ සම සභාපතිත්වය ඇති බාලි ක්‍රියාවලියට, සරණාගතයන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් (UNHCR), සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය (IOM), සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) මෙන්ම නිරීක්ෂණ මට්ටමේ ඇති රටවල් සහ ජාත්‍යන්තර සංවිධානද ඇතුළු, සාමාජිකයන් 48 කට වඩා ඇත.

2016 මාර්තු මස පැවති බාලි ක්‍රියාවලිය සම්බන්ධ හයවන කලාපීය අමාත්‍යවරුන්ගේ සම්මන්ත්‍රණයේදී, මුදල් විශුද්ධිකරණය සහ අපරාධවලින් ලැබෙන මුදල් අපරාධ වැරදි බවට පත්කිරීම, මිනිස් ජාවාරම සහ මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සඳහා කරන මූල්‍යමය දිරිගැන්වීම් ඉලක්ක කිරීම සම්බන්ධ රාජ්‍යයන්ගේ වගකීම, අමාත්‍යවරුන් විසින් සටහන් කල අතර මෙම මාතෘකාව සම්බන්ධ පුහුණුව ලබාදීම සහ කලාපීය මර්ගෝපදේශ වර්ධනය කරන ලෙස බාලි ක්‍රියාවලියේ මිනිස් ජාවාරම් සම්බන්ධ ක්‍රියාකාරී කණ්ඩායම (ක්‍රියාකාරී කණ්ඩායම) හට නිර්දේශ කරන ලදී. මින් පසුව 2016 මැයි මාසයේදී, මුදල් ෆෝරමයට පසුව, ක්‍රියාකාරී කණ්ඩායම විසින් බාලි ක්‍රියාවලිය පැවැත්වූ අතර ඒ මගින් නිර්දේශ කලේ කියාකාරී කණ්ඩායම මගින් කලාපීය ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් (මාර්ගෝපදේශය) සහ මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ කටයුතුවලදී මූල්‍ය විමර්ශන මෙවලම් භාවිතා කිරීම සම්බන්ධ පුහුණු මොඩියුල වර්ධනය කල යුතු බවයි.

2016 මැයි මස පැවැත්වූ දෙවන වාර්ෂික රැස්වීමේදී, මෙම නිර්දේශය *2016-17 සඳහාවූ ඉදිරි වැඩ සැලසුම* යටතේ ඉදිරියට ගෙනයාමට ක්‍රියාකාරී කණ්ඩායම එකඟවුණු අතර ඉන්දුනීසියානු ජනරජය සහ ඕස්ට්‍රේලියනු රජයන්හි සම සභාපතිත්වය යටතේ මාර්ගෝපදේශය කෙටුම්පත් කිරීමට කෙටුම්පත් කමිටුවක් ස්ථාපනය කරන ලදී. කෙටුම්පත් කමිටුවට ඕස්ට්‍රේලියාව, බංගලාදේශය, ඉන්දුනීසියාව, පිලිපීනය, තායිලන්තය, සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) යන රටවල සහ ආයතනවල මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ මිනිස් ජාවාරම සහ වාණිජ වශයෙන් මිනිසුන් එහා මෙහා ගෙනයාම සම්බන්ධ විශේෂඥයන්ගෙන් සමන්විතවේ. මාර්ගෝපදේශයේ කෙටුම්පත් බාලි ක්‍රියාවලියේ සාමාජිකයන් සහ නිරීක්ෂකයන් හට ලිඛිත අදහස් සහ විවේචන සඳහා ලබාදුන් අතර ඉන්දුනීසියාවේ, බාලි හි 2017 මැයි 23-24 අතර පැවති බාලි ක්‍රියාවලි පූර්ණ මන්ත්‍රණ වැඩමුළුවකදී සාකච්ඡා කරන ලදී. මෙම මාර්ගෝපදේශය පසුව 2017 ඔක්තෝබර් මස පැවති බාලි ක්‍රියාවලි තත් කාර්ය ජ්‍යෙෂ්ඨ නිලධාරී කණ්ඩායම් රැස්වීමකදී අවසන් කර අනුමත කරන ලදී.

මෙම මර්ගෝපදේශය ස්වේච්ඡා සහ බැඳීම් ඇති නොකරන අතර අරමුණ වූයේ බාලි ක්‍රියාවලි සාමාජික රටවල මිනිස් ජාවාරම් නඩු කටයුතු විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සම්බන්ධ වගකීම ඇති නීති සහ යුක්ති නිලධාරීන් හට සලකා බැලීමේ මෙවලමක් වශයෙන් පමණි.

සංකේත නම් සහ කෙටි යෙදුම්

ARIN-AP	වත්කම් නැවත ලබා ගැනීමේ අන්තර් ඒජන්සි ජාලය - ආසියා පැසිෆික්
ASEAN	අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය
Bali Process	මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය
FATF	මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය
FIU	මූල්‍ය බුද්ධි අංශය
ILO	ජාත්‍යන්තර කම්කරු සංවිධානය
IOM	සංක්‍රමණය සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානය
MOU	අවබෝධතා ප්‍රකාශය
NGO	රාජ්‍ය නොවන සංවිධානය
සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥප්තිය	ජාතීන් අතර සංවිධානයවූ අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය
RSO	බාලි ක්‍රියාවලිය සම්බන්ධ කලාපීය උපකාර කාර්යාලය
මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටෝකෝලය	ජාතීන් අතර සංවිධානයවූ අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට ඌණපූරණ සපයන විශේෂයෙන් කාන්තාවන් සහ දරුවන්ව මිනිස් ජාවාරම් කිරීම වැළැක්වීම, යටපත් කිරීම, සහ දඬුවම් කිරීමට අදාල ප්‍රොටෝකෝලය
UN	එක්සත් ජාතීන්
UNHCR	සරණාගතයන් සඳහාවූ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්
UNODC	මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය

පටුන

විධායක සාරාංශය 4

1 වන කොටස: හරය **6**

1.1 මුදල් පසුපස හඹායාම යනුවෙන් කුමක් අදහස්වේද? 6

1.2 මුදල් පසුපස හඹායන්නේ ඇයි 6

1.3 මිනිසුන් වාණිජ වශයෙන් එහාමෙහා ගෙනයාමේ මූළ වටිනාකම කොපමණද? 7

1.4 නව ආකාරයට සිතීම - අවස්ථා සහ අභියෝග 7

1.5 කාරක අධ්‍යයනය 8

2 වන කොටස: නෛතික රාමුව **9**

2.1 ජාත්‍යන්තර සම්මත 9

2.2 මුදල් විශුද්ධිකරණය සම්බන්ධ පුළුල් අපරාධ 9

2.3 වත්කම් රාජසන්තක කිරීම සම්බන්ධ සඵල රාමුව 10

2.4 අවහිර කල හැකි සහ නැවත අයකර ගත හැකි කුමන වත්කම්ද? 11

3 වන කොටස: මිනිස් ජාවාරම හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද **12**

3.1 මුදල් විශුද්ධිකරණය කරන්නේ කෙසේද? 12

3.2 බහුල ලෙස කරන මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද 13

3.3 මිනිස් ජාවාරම් අවස්ථාවලදී මුදල් විශුද්ධිකරණය 14

4 වන කොටස: මූල්‍ය බුද්ධි අංශ (FIU) **15**

4.1 රජය මගින් මුදල් විශුද්ධිකරණ ක්‍රියාකාරකම් හඳුනා ගන්නේ කෙසේද? 15

4.2 FIU වෙතින් කුමක් කරයිද? 16

4.3 ඔබගේ විමර්ශණයට FIU වෙතින් කෙසේ උපකාර කල හැකිද? 16

4.4 කාරක අධ්‍යයනය 18

5 වන කොටස: විමර්ශන **20**

5.1 මූල්‍ය විමර්ශණය යනු කුමක්ද? 20

5.2 මුදල් එහා මෙහා ගිය ආකාරය සහ ගිය ස්ථානය පෙන්වන්නේ කෙසේද? 20

5.3 තොරතුරු සහ සාක්ෂි රැස් කිරීම 21

5.4 කාරක අධ්‍යයනය 24

6 වන කොටස: ජාත්‍යන්තර සහයෝගීතාවය **25**

6.1 ජාත්‍යන්තර සහයෝගීතාවය වැදගත් වන්නේ ඇයි? 25

6.2 මූල්‍ය විමර්ශණ සඳහා බහුලව උපයෝගී කරගනු ලබන ජාත්‍යන්තර සහයෝගීතා ආකාර 25

6.3 සැලකිය යුතු වැදගත් කරුණු 26

7 වන කොටස: නව ගෙවීම් ක්‍රමවේද **28**

8 වන කොටස: හෝඩුවාවල සාරාංශය **29**

විධායක සාරාංශය

මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනඒම, දරුණු මානව හිමිකම් ප්‍රතිවිපාක ඇති දරුණු අපරාධ වරදකි. මෙය සංවිධානයවූ අපරාධ අතර වඩාත්ම ලාභදායී ව්‍යාපාර ආකෘතියකි. ගණන් බලා ඇති ආකාරයට, මෙය ලෝකයේ දෙවනි විශාලතම නීතිවිරෝධී ආදායම් මූලාශ්‍රය වන අතර දෙවෙනි වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරමට පමණි.[1] ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් ගණන් බලා ඇති ආකාරයට මිනිස් ශ්‍රමය බලෙන් ලබා ගැනීම සහ මිනිස් ජාවාරම යනු ලොව පුරා වසරකට US$150 ක් උපයන කර්මාන්තයකි.[2]

මේවා ඇති බවට සහ ජාවාරමට ලක්වන අය කෙරෙහි ඇති බලපෑම වඩා දරුණු බවට වැඩි වශයෙන් පිළිගත්තද, ලොවපුරා මේ සම්බන්ධයෙන් වැරදිකරුවන් කිරීමේ අනුපාතය ඉතා අඩුය. මුදල් පසුපස ලුහුබැඳ යාම මගින් නීතිවිරෝධී ලෙස මුදල් ගලා එන ස්ථාන සොයා ගැනීම සහ නඩු පැවරීමට උපකාර කරන සාක්ෂි එක්රැස් කිරීමට උපකාර වන අතර, අපරාධ ජාල හට ලැබෙන නීතිවිරෝධී ලාභ අහිමි කිරීම සඳහා වත්කම් අත්පත්කර ගැනීමට හැකිවේ. මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ වත්කම් නැවත ලබා ගැනීම වැනි ක්‍රමවේදයන් භාවිතාකර, මුදල් පසුපස ලුහුබැඳ යන ප්‍රවේශයක් ඇතුලත් කිරීම මගින් මිනිස් ජාවාරම සම්බන්ධ නීතිය බලාත්මක කිරීමේ ප්‍රතිචාර වැඩිදියුණු කල හැකි ආකාරය ප්‍රතිපත්ති මාර්ගෝපදේශයේ දක්වා ඇත.

මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ (FATF) සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ දක්වා ඇති ආකාරයට මුදල් විශුද්ධිකරණය සහ අපරාධවලින් ලැබෙන මුදල්වලට එරෙහිව සටන් කිරීමට රාජ්‍යයන් හට වගකීමක් ඇත. මේවා අතරට මුදල් විශුද්ධිකරණය සම්බන්ධ පෘතුල ආකාරයට අපරාධ නීතිගත කිරීම, අපරාධවලින් ලැබෙන මුදල් තහනම් කිරීම, අල්ලා ගැනීම සහ රාජසන්තක කිරීම සම්බන්ධ සඵල ක්‍රමවේදයක් ඇති කිරීම ඇතුලත්වේ.

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය මගින් බාලි ක්‍රියාවලි සාමාජික රටවල්වල අත්දැකීම මගින් දැනුවත්වූ ආකාරයට මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය සහ මිනිස් ජාවාරම්කාර ජාල මගින් උපයෝගී කරන්නා බහුල ක්‍රමෝපායන් විග්‍රහ කෙරේ. මුදල් පසුපස ලුහුබැඳ යාමේ ප්‍රවේශය අනුව මූල්‍ය බුද්ධි අංශ (FIU) මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්‍යය පිළිගනිමින්, මාර්ගෝපදේශය මගින් නීතිය සහ යුක්තිය පසිදලන ඒජන්සි සහ FIU අතර සහයෝගීතාවය වැඩි දියුණු කර ගත හැකි හෝඩුවාවන් ලබාදේ. මාර්ගෝපදේශ මගින් මූල්‍ය විමර්ශනයක් කිරීමේදී ජාත්‍යන්තර සහයෝගීතා යාන්ත්‍රණ ඇතුලත්ව ඉතාම යහපත් ප්‍රායෝගික උපදෙස් සහ විෂය අධ්‍යයනයන් ඇතුලත්ව, ගතයුතු ප්‍රධාන පියවර දක්වා ඇත.

මෙම මාර්ගෝපදේශය ලබාදී ඇත්තේ මිනිස් ජාවාරම් සම්බන්ධ අපරාධ සමග සටන් කිරීමට, මෙම අපරාධය ලාභ ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ආර්ථික යථාර්ථය යන ඉලක්කය සම්බන්ධයෙන් වෘත්තිකයන් හට උපකාර කිරීමට ඔවුන් විසින් උපයෝගී කරගනු ලබන මෙවලම් වැඩිදියුණු කර ගැනීම සඳහා යොමුවක් වශයෙනි. මෙය බාලි ක්‍රියාමාර්ගයේ නව අවධානයක් වන අතර, ජාතීන් අතර සිදුවන අපරාධ අඩපණ කිරීම සහ අපරාධකරුවන් වැඩිපුරම අරමුණු කරන්නේ කුමක්ද - ඔවුන්ගේ ලාභ ආදිය සම්බන්ධයෙන් මූල්‍ය විමර්ශන මෙවලම් යොදා ගැනීම සම්බන්ධයෙන් ලොව පුරා ඇති පිළිගැනීමට අනුකූලවේ.[3]

1 http://digitalcommons.ilr.cornell.edu/cgi/viewcontent.cgi?article=1016&context=forcedlabor
2 http://www.ilo.org/wcmsp5/groups/public/---ed_norm/---declaration/documents/publication/wcms_243391.pdf
3 උදාහරණ වශයෙන්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය මිනිස් ජාවාරම සහ වහල්බව සම්බන්ධ ප්‍රථම යෝජනාව (2331) 2016 දෙසැම්බර් 16 වන දින නිකුත් කරන ලදී. මෙයින් සිදුවූයේ FATF සහ FATF ආකාරයේ කලාපීය ආයතන සහ රාජ්‍යයන් විසින් මිනිස් ජාවාරම සහ නූතන වහල්භාවය හා ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහය අඩපණ කිරීම ශක්තිමත් කරන විවිධ ක්‍රියාමාර්ග ගැනීමට උනන්දු කිරීමයි.

1 වන කොටස: හරය

1.1 මුදල් පසුපස හඹායාම යනුවෙන් කුමක් අදහස්වේද?

සංවිධානයවූ අපරාධවල ජීවනාලිය මුදල්වේ. කාලයක් මුළුල්ලේ, අපරාධ වඩා විචිත්‍රවී ඇති අතර ජාත්‍යන්තර ස්වරූපයක් ගෙන ඇත. තවද, අපරාධකරුවන් සිය අපරාධවලින් උපයන මුදල් සැඟවීමේ නව මං නිරන්තරයෙන් සොයා යනු ඇත. මෙයට ප්‍රතිචාර වශයෙන් නීතිය සහ යුක්තිය පසිඳලන ආයතන මගින් දරුණු සහ සංවිධානයවූ අපරාධ ක්‍රියාකාරකම් සමග සටන් කිරීම සඳහා වැඩි වැඩියෙන් මුදල් පසුපස ලුහුබැඳ යාමේ ප්‍රවේශයක් අනුගමනය කරනු ඇත. මෙයට අපරාධයේ මූල්‍ය මුහුණුවර සම්බන්ධයෙන්ද අවධානය යොමු කිරීම ඇතුලත්වේ.

මූල්‍ය විමර්ශනයක් යනු යම් පුද්ගලයෙකුගේ, මිනිසුන්ගේ හෝ ව්‍යාපාරයක මූල්‍ය කටයුතු සම්බන්ධව කරන ඕනෑම විමර්ශනයකි. මූල්‍ය විමර්ශනයක මූලික අරමුණ වන්නේ අපරාධකරුවන් සොයාගෙන ඔවුන් හට නඩු පවරා අපරාධයෙන් උපයා ගත් මුදල් නැවත ලබා ගැනීමේ අවසාන අරමුණ ඇතිව සැකකරනු ලබන අපරාධ ක්‍රියාකාරීත්වය සිදුවන අතරතුර මුදල් ගලාගිය ආකාරය හඳුනා ගැනීම සහ වාර්තා කිරීමවේ. මුදල්වල මූලාශ්‍රය සම්බන්ධයෙන් ඇති පුරුක්, ප්‍රතිලාභීන්, මුදල් ලැබුණ දිනය, සහ ඒවා ගබඩා කිරීම හෝ තැන්පත් කිරීම කර ඇති ස්ථාන සොයා ගැනීම මගින් අපරාධ ක්‍රියාකාරකම සම්බන්ධ අගනා තොරතුරු ලබාදිය හැකිය.

මුදල් පසුපස ලුහුබැඳයාමේ ප්‍රවේශය මගින් මූලික කරුණු දෙකක් ඉටු කරයි: මුදල් විශුද්ධිකරණයට එරෙහි උපායමාර්ගයන් සහ වත්කම් නැවත සොයා ගැනීමේ මෙවලම්. මුදල් විශුද්ධිකරණය යනු නීතිවිරෝධී ආකාරයට ලබාගත් මුදල්වල අනන්‍යතාවය, මූලාශ්‍රය, අයිතිය සහ ගමනාන්තය සැඟවීම සම්බන්ධයෙන් සිදු කරන අපරාධ වරදවේ. වත්කම් නැවත සොයා ගැනීම යනු සියළුම අපරාධවලින් ලබාගත් මුදල් විමර්ශනය කිරීම, තහනම් කිරීම සහ අහිමි කිරීම සිදු කරන ක්‍රියාවලියයි.

1.2 මුදල් පසුපස හඹායන්නේ ඇයි

වෙනත් සංවිධානයවූ අපරාධ මෙන්ම, සිය ලාභ සම්බන්ධ නීතිවිරෝධී මූලාශ්‍ර සැඟවීම සහ සිය ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යාමට ඉඩකඩ ලබා ගැනීම ආදී විවිධාකාර මුදල් විශුද්ධිකරණ ක්‍රම මිනිස් ජාවාරම් කරුවන් විසින්ද උපයෝගී කර ගැනේ. මේ හේතුව නිසා, මිනිස් ජාවාරම් කටයුතු විමර්ශනය කිරීමේදී මුදල් පසුපස හඹායාමේ ප්‍රවේශය උපයෝගී කර ගැනීමේ ප්‍රතිලාභ ඇත.

- මිනිස් ජාවාරම හා ආශ්‍රිත මුදල් ප්‍රවාහය සොයා ගැනීම මගින් විමර්ශකයන් හට අපරාධ ජාලයක සාමාජිකයන්ව සහ ගොදුරුවූවන් හඳුනා ගැනීමට සහ නඩු පැවරීමට අවශ්‍ය සාක්ෂි රැස්කිරීමට උපකාරවේ.
    - මේ මගින් ගොදුරුවූවන් වෙතින් ලබා ගන්නා ප්‍රකාශ මත විශ්වාසය තැබීමට අවශ්‍ය වන ප්‍රමාණය අඩුකර ගත හැකිය.
    - මේ මගින් නීතිවිරෝධී ජාලයක ප්‍රධාන ක්‍රීඩකයන් සහ ප්‍රතිලාභීන්ව හඳුනා ගැනීම, ලාභ ලබන අය වුවද අපරාධයෙන් දුරස්ව සිටීමට උත්සාහ කරන අයව හඳුනා ගැනීමට හැකිවේ.
- මුදල් විශුද්ධිකරණ වැරදි මිනිස් ජාවාරමේ නියුතු අපරාධකරුවන්ට විරුද්ධව නඩු පැවරීම සම්බන්ධ වෙනත් මාර්ගයක් ලබාදේ. මෙය වැදගත්විය හැකි වන්නේ මිනිස් ජාවාරම් සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් සාර්ථකව නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි නැති අවස්ථාවක මිනිස් ජාවාරම සම්බන්ධ වැරදි උපයෝගී කර ගනිමින් සාර්ථක නඩු පැවරීමක් කල හැකි වීමයි. මේ මගින් වෙනත් මූල්‍ය රෙගුලාසි උල්ලංඝනය කිරීම්ද නිරාවරණයකර ගත හැකිවේ.
- ලබාගත් ප්‍රතිලාභ අහිමි කිරීම මගින්ද නිවාරක බලපෑමක් ඇතිවේ. මේ මගින් සිර දඬුවම් විඳීමේ අවදානම ගන්නා අපරාධකරුවන් හට නිදහස්වීමෙන් පසු ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන බව අවබෝධවේනම්, එම අවදානම දැරීමේ උනන්දුව අඩුවේ.
- මිනිස් ජාවාරම ආශ්‍රිතව ලබාගන්නා මුදල් සඵල ආකාරයට අහිමි කිරීම මගින් එම මුදල් නැවත අපරාධ ක්‍රියාකාරකම්වල ආයෝජනය කිරීම වළක්වා ගත හැකිවන අතර මිනිස් ජාවාරමට එරෙහි උත්සාහයන් වැඩිදියුණු කිරීමට උපයෝගී කර ගත හැකි අතර ඒවා ගොදුරුවූ අයට උපකාර ලබාදීමටද උපයෝගී කර ගත හැකිය.
- මිනිස් ජාවාරම ඇතුළු පුළුල් පරාසයක අපරාධ සම්බන්ධයෙන් වැරදිකරුවන් නොකර දේපළ අහිමි කිරීමේ රාමුවක[4] ක්‍රියාත්මක කිරීම මගින්ද වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිවේ. අපරාධවලින් ලාභ ලැබුවද, අපරාධ ක්‍රියාකාරකම්වලින් දුරස්ව සිටින අයව ඉලක්ක කර ඔවුන්ව අපරාධ වරදකට ලක් නොකර සිටීම සඳහා මෙම ක්‍රියාමාර්ග මගින් රටවල් හට වැඩි අවස්ථා ලබාදේ.

4 අපරාධ වරදකින් ලබාගත් මුදල් නැවත ලබා ගැනීම සඳහා ආකාර දෙකක් ඇත: අපරාධයට වැරදිකරු කර මුදල් ලබා ගැනීම. මෙහිදී සිදුවන්නේ වැරදිකරු කල පසු අපරාධය සම්බන්ධ වත්කම් ලබාගැනීමවේ. අනෙක් ක්‍රමය නම්, අපරාධ වරදකට වරදකරු නොකර (සිවිල් නඩු කටයුතු ආකාරයට) වත්කම් ලබාගැනීමවේ. මේ මගින් සිදුවන්නේ අපරාධ වරදකට වරදකරු නොකර අපරාධ වරදක් හා සම්බන්ධ යයි සැකකරන වත්කම් තහනම් කර ලබාගැනීමවේ.



1.3 මිනිසුන් වාණිජ වශයෙන් එහාමෙහා ගෙනයාමේ මුළු වටිනාකම කොපමණද?

මිනිස් ජාවාරම ගෝලීය පරිමාණයෙන් කෙරෙන ඉතා ලාභදායක ව්‍යපාරයකි. 2014 වර්ෂයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් ගණන් බලා ඇති ආකාරයට ලොවපුරා මිනිස් ජාවාරම සහ වහල් වෙළඳාම හේතුවෙන් නීතිවිරෝධී ලෙස ලබා ඇති ලාභය බිලියන US$150.2 කි.[5] ලාභවලින් තුනෙන් දෙකක් - බිලියන US$99 - පමණම පැමිණ ඇත්තේ බලහත්කාර ලිංගික උපයෝජනය මගිනි.[6] දේශීය නොවන ශ්‍රමය උපයෝජනය මගින් US$43.4 ක් ලාභ ලබා ඇති අතර බිලියන US$8 ක් පමණම දේශීය ශ්‍රමිකයන් උපයෝජනය මගින් ලබාගෙන ඇත. බොහෝ ගොදුරුවූ අය ආසියාවේ හේතුවෙන් වැඩිම ලාභ ලබා ඇත්තේ ආසියාව තුලය. එක් ගොදුරුවූ අයෙකුගෙන් ලැබෙන වාර්ෂික ලාභය වැඩිම දියුණු ආර්ථිකයන් ඇති රටවලය (දළ වශයෙන් ගොදුරුවූ අයෙකු සඳහා US$34,800 ක්).

1.4 නව ආකාරයට සිතීම - අවස්ථා සහ අභියෝග

සාම්ප්‍රදායිකව මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමේදී අවධානය යොමුව තිබුණේ මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ අපරාධ වරද කෙරෙහි මිස, අපරාධයෙන් ලැබෙන මුදල් හෝ අපරාධය වෙත මුදල් ආයෝජනය කිරීම වෙත නොවේ.[7] අපරාධකරුවාගේ හැසිරීම සම්බන්ධ මූල්‍ය කරුණු මත අවධානය යොමු කිරීම ශක්තිමත් කිරීම මගින් අවස්ථා විශාල ගණනාවක් ඇතිවන අතර අභියෝගයන්ද ඇති කරයි. මිනිස් ජාවාරම සම්බන්ධ කටයුත්තක සාර්ථකත්වය කුමක්ද යන්න අපගේ අවබෝධය පුළුල් කිරීම ප්‍රධාන අංගයකි. මෙයට වත්කම් අහිමි කිරීම මගින් ඇතිවන දායකත්වය පිළිගැනීම සහ මෙම ආකාරයේ අපරාධවලට එරෙහිව සටන් කිරීම සඳහා නඩු කටයුතුවලට බැසීමට විකල්ප මාර්ගයක් වශයෙන් මුදල් විශුද්ධිකරණය භාවිතා කිරීම ඇතුලත්වේ.

හෝඩුවාවන්

ආපසු ලබාගත් වත්කම් සම්බන්ධ සංඛ්‍යාලේඛණ රැස් කිරීම සහ මිනිස් ජාවාරම සම්බන්ධ ජාල කඩාබිඳ දැමීමට මුදල් විශුද්ධිකරණය සම්බන්ධ අපරාද වැරදි උපයෝගී කර ගැනීම. ඔබගේ රාජ්‍යයේ මිනිස් ජාවාරම් සම්බන්ධ කටයුතුවලදී කාර්ය සාධක ඇගයීම් ලෙස මේවා ඇතුලත්කර ගැනීම සලකා බලන්න.

හෝඩුවාවන්

ඔබගේ සංවිධානයේ සියළුම මට්ටම්වල මුදල් ලුහුබැඳයාමේ ප්‍රවේශය අනුගමනය කිරීමට ඉහළ මට්ටමින් උපකාර කිරීමට උනන්දු කරන්න. උදාහරණ වශයෙන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මෙම ප්‍රවේශයට උපකාර කරන ආකාරයේ ප්‍රසිද්ධ ප්‍රකාශන නිකුත්කල හැක.

තවත් ගැටළුවක් වන්නේ මිනිස් ජාවාරමට සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි ප්‍රජා බොහෝ අවස්ථාවල කටයුතු කරන්නේ හුදකලාව වීමයි. නීතිය බලාත්මක කරන ආයතන බොහෝ අවස්ථාවල මිනිස් ජාවාරමට අදාල මූල්‍ය ක්‍රියාකාරකම් මෙහෙයවන ආකාරය නොදන්නා හෝ ඒ සම්බන්ධයෙන් පුහුණුකර නැති අතර මූල්‍ය විමර්ශකයන් හට මිනිස් ජාවාරම් කරන අයගේ ව්‍යාපාර ආකෘති, වෙළඳපල, සහ නීතිවිරෝධී අරමුදල් එහා මෙහා කිරීම සම්බන්ධ මනාප සම්බන්ධ විස්තරාත්මක දැනුමක් නැතිවිය හැකිය. මෙම දෘෂ්ඨිකෝණ එක් කිරීම මගින් මිනිස් ජාවාරමට එරෙහිව අපගේ උත්සාහයන් ඉතා ඉහළ මට්ටමකට ගෙනා ආ හැකිමුත්, සංවිධාන තුල ඇති තොරතුරු බෙදාහදා ගැනීමට ඇති අකමැත්ත බිඳ දැමීම සඳහා රාජ්‍යයන් හට දැඩි කැප කිරීමක් තිබිය යුතුය. මෙම ප්‍රවේශය යොදා ගැනීම සඳහා රාජ්‍යයන් සහ ඒවායේ ආයතන හට උපකාර කිරීම සඳහා දැනීම වැඩි කිරීම සහ හැකියාව වර්ධනය කරන ක්‍රියාකාරකම් අවශ්‍යවේ.

හෝඩුවාවන්

මිනිස් ජාවාරම් සම්බන්ධ අපරාධ වැරදි පූර්ණ වශයෙන් විමර්ශනය කරන බවට සහතිකවීම සඳහා සියළුම අදාල ආයතනවල (පොලීසිය, අභිචෝදකයන්, සහ FIU) විශේෂඥ දැනුම එක්තැනකට ගෙන එම සඳහා ක්‍රියාකාරී උපාය මාර්ගයන් වර්ධනය කරන්න.

5 රාජ්‍යයන් මගින් බලාත්මක කල බලෙන් ශ්‍රමය ලබා ගැනීම ඇතුලත් කර නැත.
6 *ලාභ සහ දිළිදුතාවය: බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීමේ අර්ථ ශාස්ත්‍රය, 12-13 පිටු*
7 මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණ පාලන තන්ත්‍ර ලීවරණය කිරීම (2014), යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගීතාවය සඳහාවූ කාර්යාලය (OSCE) https://www.osce.org/secretariat/121125?download=true

මූල්‍ය කටයුතු සම්බන්ධ තොරතුරු විගස හුවමාරු කර ගැනීම සඳහා මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය මුදල් විශුද්ධිකරණයට අදාල ශිල්ප ක්‍රම භාවිතා කිරීම වැඩි කිරීම සඳහා රටවල් අතර සහයෝගීතාවයද අවශ්‍යවේ. FIU අතර තොරතුරු හුවමාරුවීම වැනි, මිනිස් ජාවාරමට අදාල විමර්ශන සඳහා මුදල් විශුද්ධිකරණ ගැටළු සම්බන්ධ ජාත්‍යන්තර සහයෝගීතාවය ඇති ජාල භාවිතා කිරීම වාසිදායක වනු ඇත. පුද්ගලික අංශය, මිනිස් ජාවාරම හේතුවෙන් උපයන ලාභ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙනයාම සම්බන්ධ පාර්ශවකරුවෙකු වශයෙන් කටයුතු කිරීම හේතුවෙන්, රාජ්‍යයන් විසින් පුද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කල යුතුය.

1.5 කාරක අධ්‍යයනය

2015 මැයි 1 වන දින, ඒකාබද්ධ මිලිටරි-පොලිස් කාර්‍ය සාධක බලකායක් මගින් තායි-මැලේසියානු දේශසීමාවට ආසන්නයේ සොංග්කාලා පළාතේ සඩාඕ දිස්ත්‍රික්කයේ අත්හැර දැමූ කඳවුරක තිබී මළමිනි අඩුතරමින් 30 ක් සොයා ගන්නා ලදී. මිනිස් ජාවාරම් සහ හොරබඩු ජාවාරම් ජාල සම්බන්ධයෙන් සැක කිරීම හේතුවෙන් පොලිස් විමර්ශනවලට සහායට රාජකීය තායි පොලීසිය මගින් අදාල නඩු කටයුත්තට සම්බන්ධ මූල්‍ය ක්‍රියාකාරකම් විමර්ශනය සඳහා තායිලන්තයේ මූල්‍ය බුද්ධි ඒකකය වන මුදල් විශුද්ධිකරණයට එරෙහිව කටයුතු කරන කාර්‍යාලය (AMLO) හා සම්බන්ධ වන ලදී.

AMLO හි දත්ත පද්ධතියේ ගනුදෙනු වාර්තා භාවිතා කරමින්, AMLO හි නිලධාරීන් විසින් වයර් ගනුදෙනු වාර්තා (දේශීය සහ ජාත්‍යන්තර), දේශසීමා මුදල් වාර්තා, සැකකටයුතු ගනුදෙනු වාර්තා, මුදල් ගනුදෙනු වාර්තා, සහ දේපළ ගනුදෙනු වාර්තා සෙවුම් කරන ලදී.

ඔවුන්ගේ දත්ත පද්ධති සෙවීමට අමතරව, AMLO මගින් වෙනත් ආයතන වෙතින් විවිධාකාරයේ තොරතුරු AMLO වෙත වාර්තා කරන ලෙස ඉල්ලා සිටින ලදී, ඒවා අතරටඃ

- වෙනත් මූල්‍ය ආයතන වෙතින් ගිණුම් හිමිකරුවන්ගේ තොරතුරු සහ පාරිභෝගික ගනුදෙනු විස්තර (ගිණුම් ප්‍රකාශන ඇතුළුව)
- තායි ඉඩම් කාර්‍යාලය වෙතින් දේපළ අයිතිකරුවන්ගේ වාර්තා, අත්පත්කර ගැනීම්, සහ සැකකරුවන්ට අදාල විකුණුම්
- ආදායම් බදු කාර්‍යාලය වෙතින් නඩුවේ ප්‍රධාන සැකකරුවන් විසින් ප්‍රකාශ කල ඉපැයුම්, පුද්ගලික සහ ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ වාර්තා, සහ ප්‍රකාශිත බැංකු කටයුතු සම්බන්ධ වැඩපිළිවෙලවල් ඇතුළු ඔවුන්ට සම්බන්ධ බදු තත්වයට අදාල වාර්තා
- ව්‍යාපාර සංවර්ධනය සම්බන්ධ දෙපාර්තමේන්තුව වෙතින් හඳුනාගත් ව්‍යාපාරවලට සම්බන්ධ සමාගම් සහ පුද්ගලයන්ගේ ලිපිනයන්, කොටස්කරුවන්, මූල්‍ය පැතිකඩ ඇතුළු විස්තර

බැංකු ප්‍රකාශන සහ වයර් ට්‍රාන්සර් විස්තර උපයෝගී කරගනිමින් AMLO හට නඩුවට අදාල අත් අඩංගුවට ගත් සැකකරුවන්ගේ මූල්‍ය ගනුදෙනුවලින් අමතර ප්‍රධාන සැකකරුවන් සොයාගත හැකිවිය. මේවා මගින් පෙන්වූයේ අත්අඩංගුවට ගත් සැකකරුවන් විසින් තායිලන්තය තුල නව සැකකරුවන් හට ඍජු ආකාරයට ගිණුම්වලට මුදල් යැවූ බවයි. ඉන්පසුව තායිලන්තය සහ මැලේසියාව අතර මුදල් යැවීමට, කෑෂ් කුරියර්ස් සහ නීතිවිරෝධී ආකාරයට මුදල් යවන අය ඇතුළු වෙනත් ගෙවීම් ආකාර උපයෝගී කර ගත් බව පෙන්වීමට AMLO හට හැකිවිය. AMLO විසින් මූල්‍ය තොරතුරු රැස්කිරීම සහ රාජකීය තායි පොලීසියේ මිනිස් බුද්ධිය උපයෝගී කර මුදල් යැවීමේ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකර ඒ මගින් මෙම ගනුදෙනු එකට එක්කල හැකිවිය.

මූල්‍ය විමර්ශනය සහ බුද්ධි අංශ භාවිතයෙන් හඳුනාගත් ප්‍රධාන සැකකරුවන් අතර, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අපරාධ ජාලයක සැකකාර සංවිධායකයෙකු, පළාත් පරිපාලන සංවිධානයක හිටපු ප්‍රධානියෙක් නගරාධිපතිවරයෙක් සහ සැලකිය යුතු මට්ටමේ ව්‍යාපාරිකයෙකු සිටින ලදී. සැකකරුවන්ට එරෙහිව මිනිස් ජාවාරම සහ මුදල් විශුද්ධිකරණයට අදාල චෝදනා ගොනු කරන ලදී. AMLO මගින් අපරාධයට අදාල නීතිවිරෝධී ලාභ තහනම් කිරීම සඳහා අධිකරණ නියෝග ඉල්ලා සිටින ලදී.

මෙම නඩුකටයුත්ත මගින් පෙන්වන්නේ මූල්‍ය විමර්ශන ක්‍රමවේද භාවිතය මගින් වැරදිකරුවන් සම්බන්ධ පුළුල් ජාල, සහ ඔවුන් අතර ඇති සම්බන්ධතා සහ සාක්ෂි නිරාවරණය කර ගත් ආකාරයවේ. එම ක්‍රමවේදය උපයෝගී කර ගත්තේ නැතිනම් එම අවස්ථා මගහැරී යාමට ඉඩ තිබුණි.

2 වන කොටස: නෛතික රාමුව

2.1 ජාත්‍යන්තර සම්මත

මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සාමාජිකයන් 37 දෙනෙකුගෙන් සමන්විත, මුදල් විශුද්ධිකරණය සම්බන්ධ ජාත්‍යන්තර සම්මතයන් ඇතිකරන, සහ ඒවා රටවල් මගින් ක්‍රියාත්මක කරන ආකාරය ඇගයීමේ වගකීම ඇති රජයන් අතර ඇති ආයතනයකි.[8] මුදල් විශුද්ධිකරණය සහ අපරාධවලින් ලබා ගන්නා මුදල් සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම ඇතුලත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති ගණනාවක්ද ඇත.[9] මෙම සම්මතයන් අතර ඇතුලත්කර ඇති රාජ්‍යයන් සඳහාවූ ප්‍රධාන වගකීම් අතර, මුදල් විශුද්ධිකරණය සම්බන්ධ පුළුල් අපරාධ වැරදි නීතිගත කිරීම, සහ අපරාධවලින් ලැබෙන ලාභ තහනම් කිරීම, අල්ලා ගැනීම සහ රාජසන්තක කිරීම සම්බන්ධ සඵල ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ඇතුලත්වේ.

2.2 මුදල් විශුද්ධිකරණය සම්බන්ධ පුළුල් අපරාධ

ජාත්‍යන්තර සම්මතයන් සමඟ අනුකූලවීම සඳහා, පුළුල් මුදල් විශුද්ධිකරණ නීති මගින් පහත දේ සිදුකල යුතුය:

- මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියේ සියළු අදියර අපරාධ ලෙස සංග්‍රහගත කිරීම
- මිනිස් ජාවාරම ඇතුළු, සිදුවිය හැකි පුළුල්ම සාධනීය වැරදිවලට[10] අදාල කිරීම
- මුදල් විශුද්ධිකරණය විමර්ශනය කිරීමේදී තනි වරදක් සහ, එයට අමතරව සාධනීය වරදක් ලෙස විමර්ශනය කිරීමේ හැකියාව ලබාදීම
- දේපළක් අපරාධයකින් ලබාගත් බවට ඔප්පුකල විට සාධනීය වරදකට වැරදිකරු කිරීම අනවශ්‍ය බවට වගබලා ගැනීම
- නෛතික පුද්ගලයන් හටද අපරාධ වගකීම අදාල කිරීම (උදා. සමාගම්)
- අපරාධයකින් ලබාගත් දේ ඍජුවම හෝ ඍජු නොවන ආකාරයට පෙනෙන විට, වටිනාකමින් පරිබාහිරව සෑම දේපළකටම අදාල කිරීම
- යම් හැසිරීමක් විදේශයකදී අපරාධ වරදක් නම්, සහ සිය රටෙහිදී සාධනීය වරදක්නම්, අනෙක් රටෙහි සිදුවූ හැසිරීමටද එය දීර්ඝ කිරීම, සහ
- මුදල් විශුද්ධිකරණය යන අපරාධ වරද ඔප්පු කිරීම සඳහා අවශ්‍ය චේතනාව සහ දැනුම විෂයමූලික කරුණු අනුව අවබෝධකරගත් බවට තහවුරු කිරීම

හෝඩුවාවන්

මුදල් විශුද්ධිකරණය පෙන්වීම සඳහා ස්ථාපනය කලයුතු මූලික අංග වන්නේ මුදල් සමඟ කටයුතු කල අය එම මුදල අපරාධයකින් ලැබුණු දෙයක් බව **දැන සිටි බව** හෝ **සැකකල යුතුව තිබූ බව,** හෝ එම මුදල අපරාධයක් සිදු කිරීමේ අරමුණින් භාවිතා කිරීම යන්නයි.

8 2012 FATF නිර්දේශ සහ 2013 FATF නිර්දේශ හා තාක්ෂණික අනුකූලතාවය ඇගයීම සඳහාවූ FATF ක්‍රමවේදය සහ AML/CFT ක්‍රමවල සඵලතාවය.

9 මේවා අතරට: *නීතිවිරෝධී ආකාරයට මත්ද්‍රව්‍ය සහ මානසික බලපෑම් ඇතිකරවන ද්‍රව්‍යවලට එරෙහිව ඇති එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය 1988* (වියානා ප්‍රඥප්තිය), *ජාතීන් අතර සංවිධානයවූ අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය 2000* (UNTOC හෝ පැලමෝර් ප්‍රඥප්තිය), සහ *දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය 2003* (UNCAC).

10 සාධනීය අපරාධ වරදක් යනු වෙනත් අපරාධ ක්‍රියාවකට අවශ්‍ය සම්පත් සපයන ක්‍රියාවකි. උදාහරණ වශයෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා මිනිස් ජාවාරම සහ හොරබඩු ජාවාරම සාධනීය අපරාධවේ.

හෝඩුවාවන්

මුදල් විශුද්ධිකරණ සහ සාධනීය අපරාධ වැරදි සම්බන්ධයෙන් වෙන වෙනමම නඩු පැවරිය හැකිය. යම් අවස්ථාවක සාධනීය වරදක් සම්බන්ධයෙන් සාර්ථක ලෙස නඩු පැවරීමක් කර වැරදිකරු කල නොහැකි අවස්ථාවක (උදා. මිනිස් ජාවාරම), මුදල් විශුද්ධිකරණය සම්බන්ධ සාක්ෂි ඇතිනම්, නීතිය බලාත්මක කරන බලධාරීන් හට සාධනීය වරදට පරිබාහිරව මුදල් විශුද්ධිකරණය සම්බන්ධ වරද ඉලක්ක කල හැකිය.

2.3 වත්කම් රාජසන්තක කිරීම සම්බන්ධ සඵල රාමුව

වත්කම් රාජසන්තක කිරීම හෝ වත්කම් නැවත සොයා ගැනීම, යනු අපරාධයෙන් ලබාගත් දේවල් විමර්ශනය කිරීම, තාවකාලිකව අත්හිටුවීම, අහිමි කිරීම සහ කළමණාකරණයවේ. රාජසන්තක කිරීම, වැරදිකරු කිරීම (රාජසන්තක කිරීමක් කිරීමට පෙර අදාල පුද්ගලයාව අපරාධ නඩු කටයුත්තකදී වැරදිකරු කර තිබිය යුතුය) හෝ වැරදිකරු කිරීමක් නොකිරීම මත පදනම් විය හැකිය. පුළුල් වත්කම් රාජසන්තක කිරීමක් මගින් ඔබට අපරාධයෙන් ලබාගත් දේ විමර්ශනය කිරීම, ආරක්ෂා කිරීම, අල්ලා ගැනීම, රඳවා ගැනීම කල හැකිය. මෙයට වත්කම් සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයන් හට ඇති අයිතීන් සම්බන්ධ ක්‍රියාමාර්ග සහ රජයට වත්කම් අල්ලා ගැනීමටද අදාල ක්‍රියා මාර්ග ඇතුලත්වේ. අපරාධ වරදකට වැරදිකරු නොකරන රාමු ක්‍රියාත්මක කර ඇති බොහෝ රටවල් බාධා කිරීමේ උත්සාහයන් මගින් සැලකිය යුතු ආකාරයේ ප්‍රතිඵල ලබාගෙන ඇති අතර, අනාගත අපරාධ සිදුවීම වැළැක්වීමට තහනම්කල මුදල් උපයෝගී කරගෙන ඇත - උදාහරණ වශයෙන්, අපරාධ වැළැක්වීම, අධ්‍යාපනය සහ බලාත්මක කිරීමේ වැඩසටහන්.

හෝඩුවාවන්: වැරදිකරු නොකරන පදනම මත කරන අහිමිකරණය

අපරාධ වැරදි සම්බන්ධ වැරදිකරු නොකර දේපළ අත්පත් කිරීම මගින් අපරාධවලින් ලැබෙන ලාභ සම්බන්ධ ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය වැඩිදියුණු කල හැකිවේ. අපරාධ වැරදි සම්බන්ධ වැරදිකරු නොකර දේපළ නැවත ලබාගැනීම මගින් අපරාධයකට වැරදිකරු කිරීමේ අවශ්‍යතාවයකින් තොරව අපරාධ සම්භවය ඇති යයි සැකකරන දේපළ තහනම් කිරීම හෝ නැවත ලබා ගැනීම කල හැකිවේ. මේ මගින්:

- විමර්ශනයේ මුල් අවස්ථාවල වත්කම් තහනම් කිරීම, හෝ වැළැක්වීම කල හැකිවේ. මේ මගින් විමර්ශනයක් හෝ නඩු පැවරීමක් ඇති අතර වත්කම් බැහැර කිරීම වැළැක්වීමට උපකාරවේ
- අපරාධකරුවෙකු මියගොස්, සොයාගත නොහැකි හෝ හඳුනාගත නොහැකි අවස්ථාවල සාර්ථක ප්‍රතිඵල ලබාදේ
- අපරාධවලින් ලබාගත් දේවල්වලින් ලාභ ලබාගත් දේවල් රාජසන්තක කිරීමට හැකිවන අතර, ඔවුන්ව එම අපරාධ වරදින් දුරස්ථකර අපරාධයකට වරදකරු කිරීම අවශ්‍ය නොවීම, සහ
- දේපළක් තුන්වන පාර්ශවයක් අත තිබෙන අතර (අපරාධ වරදක් සම්බන්ධයෙන් හෝ අපරාධ වරදක් කිරීම සඳහා භාවිතා කල, භාවිතා කිරීමට අරමුණු කරන දේපළ) හෝ වරදකරු සන්තකයේ දේපළ ඇති විට, දේපළ රාජසන්තක කිරීමට හැකිවීම.

2.4 අවහිර කල හැකි සහ නැවත අයකර ගත හැකි කුමන වත්කම්ද?

අපරාධයක් කිරීමේදී භාවිතා කරන වත්කම් (උපකරණ) සහ අපරාධයකින් ලබාගත් දේවල් (අපරාධයකින් ලබාගන්නා දේවල්) හෝ ඒවායේ වටිනාකම තහනම්කර නැවත අයකර ගැනීමට හැකියාව ඇත. තව අයෙකුගේ නමින් අපරාධකාරයා විසින් තබා ඇති එහෙත් අපරාධකාරයා හට ඒවායේ සඵල පාලනය ඇතිවිටද එම දේපළ තහනම් කිරීමේ හැකියාව ඇත. බොහෝ අපරාධකරුවන්ගේ මූලික අභිප්‍රායක් වන්නේ ඔවුන්ගේ අපරාධයෙන් ලබාගත් ලාභ ආරක්ෂා කර ගැනීම වන අතර ඔවුන්ගේ දේපළවල මූලාශ්‍රය සහ අයිතිය සැඟවීමට අපරාධකරුවන් විසින් ගනු ලබන ක්‍රියා මාර්ග විමර්ශකයන් හට සංකීර්ණ අභියෝගයක් වී ඇත. විදේශවල ඇති දේපළ සම්බන්ධයෙන් ඇති අභියෝගයන්වලට මුහුණදීමට සහ ප්‍රතිලාභී අයිතිය ඇති අය සොයා ගැනීම සඳහා සංකීර්ණ හිමිකම් පිළිබඳ ව්‍යුහයන් නිරාවරණය කර ගැනීම පහසුවන ආකාරයට දේශීය නීතිය සුනම්‍යවිය යුතුය.

අපරාධයකින් ලබා ගන්නා දේවල් අතරට දේපළවලින් ලබාගත් ආර්ථික වාසි සහ සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් වෙනත් දේපළ බවට පත්කල දේපළ ඇතුලත්වේ. උදාහරණ වශයෙන්, මිනිස් ජාවාරම මගින් ලබාගත් මුදල්වලින් මිලට ගත් මෝටර් රථයක්, නිවසක් හෝ බෝට්ටුවක් රාජසන්තක කිරීමට හැකි වන්නේ එය මිලට ගත්තේ අපරාධයකින් ලබා ගන්නා දේවල්වලින් වන නිසාය.

අපරාධයක **උපකරණයක්** යනු අපරාධයක් කිරීමට පහසු කිරීමට භාවිතාකල දේපළක් වන අතර එයට මිනිසුන් ගෙනයාමට උපයෝගී කරගත් කාරයක් හෝ බෝට්ටුවක්, හෝ අපරාධ ක්‍රියාකාරකම්වලට උපයෝගී කරගත් මුදල් ඇතුලත්වේ. වාහනය අපරාධයකින් ලබා ගත් දෙයක් බව දැක්වීමට හෝ කලින් සිදුකල අපරාධයකින් ලැබුණු මුදල්වලින් ලබාගත් දෙයක් බවට සාක්ෂි නොමැතිවිය හැකිය. කෙසේවුවද, එය අපරාධයක් කිරීමට භාවිතා කලේනම්, එය අපරාධයේ උපකරණයක්වීම හේතුවෙන් එය රාජසන්තක කල හැකිය.

දේපලවල **සඵල පාලනය** යනුවෙන් අදහස් වන්නේ යම් අයෙකු හට දේපලකට නෛතික හෝ සාධාරණත්ව අයිතියක් ඇතිවුවද හෝ නැති වුවද හෝ දේපළ සම්බන්ධයෙන් බලයක් නැති වුවද, එම පුද්ගලයා විසින් එකී දේපල පාලනය කරනු ලැබීමයි. යම් අයෙකු හට දේපළක සඵල පාලනයක් ඇතිද යන්න තීරණය කිරීමේදී, පහත කරුණු ඇතුළු බොහෝ කරුණු සැලකිල්ලට ගනු ලැබේ:

- දේපළවලට සම්බන්ධතාවයක් ඇති (ඍජු හෝ ඍජු නොවන) සමාගමක කොටස්කාරත්වය, ණයකර හෝ අධ්‍යක්ෂකධූරය තිබීම
- දේපළවලට සම්බන්ධතාවයක ඇති භාරයක්
- දේපළවලට සම්බන්ධතාවයක් ඇති පවුල්, ගෘහාස්ථ හෝ ව්‍යාපාර අතර සම්බන්ධතාවයක් ඇති අය.

හෝඩුවාවන්: වත්කම් රාජසන්තක කිරීම සඵල ලෙස ස්ථාපනය කිරීම

පහත ආකාරයට අපරාධ වත්කම් රාජසන්තක කිරීමේ ප්‍රතිඵල වැඩිදියුණු කල හැකිය.

- සියළු නීතිය බලාත්මක කරන ආයතන, මූල්‍ය බුද්ධි ඒකක, සහ අභිචෝදකයන් හට පුළුල් ආකාරයට තොරතුරු සහ පුහුණු ලබාදීම.
- වත්කම් රාජසන්තක කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, විශේෂඥ විමර්ශන සහ අභිචෝදක කණ්ඩායම් ඇතිකිරීම.
- සියළු ආකාරයේ වත්කම් රාජසන්තක කිරීම් සඳහා විමර්ශකයන් සහ අභිචෝදකයන් අතර හැකි මුල්ම අදියරවල සමීප සම්බන්ධතා වැඩිදියුණු කිරීම.
- පහත කරුණු ඇතුළුව ඔබගේ වත්කම් රාජසන්තක කිරීමේ නෛතික රාමුව සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම:
  - වත්කම් ඇති ස්ථාන සහ ප්‍රතිලාභ අයිතිය ඇති අය සොයා ගැනීම සඳහා විමර්ශන බලය
  - අත්හිටුවීමේ, වැළැක්වීමේ සහ රාජසන්තක කිරීමේ ප්‍රතිපාදන
  - අන්‍යෝන්‍ය නීති උපකාර

3 වන කොටසඃ මිනිස් ජාවාරම හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද

3.1 මුදල් විශුද්ධිකරණය කරන්නේ කෙසේද?

මුදල් විශුද්ධිකරණ කාර්යාවලියට විවිධ අදියර ඇතුලත්විය හැකි අතර, සාමාන්‍යයෙන් එය අදියර තුනකට වෙන්කල හැකියඃ පහත දක්වා ඇති ආකාරයට **ස්ථාපනය කිරීම, ස්ථරගත කිරීම,** සහ **ඒකාබද්ධ කිරීම.**



- **ස්ථාපනය කිරීම** යනු නීතිවිරෝධී මුදල් හෝ වත්කම් මූල්‍ය ක්‍රමය තුලට ගෙනඒමවේ. උදාහරණ වශයෙන්, බැංකු ගිණුම්වලට මුදල් තැන්පත් කිරීම හෝ වත්කම් මිලට ගැනීමට මුදල් භාවිතා කිරීම මගින් මෙය කල හැකිවේ.
- **ස්ථරගත කිරීමට** ඇතුලත් වන්නේ තැන්පත් කල අරමුදල්වල ඇති නීතිවිරෝධී සම්භවය එහා මෙහා කිරීම හෝ ස්වරූප වෙනස් කිරීම මගින් සැඟවීමවේ. උදාහරණ වශයෙන් වෘත්තීකයන් අතරමැදියන් වශයෙන් ක්‍රියා කිරීම (නීතීඥයන් හෝ ගණකාධිකාරවරුන් ආදීන්) හෝ මුදල් යැවීම සඳහා සංකීර්ණ සමාගම් හෝ භාර ව්‍යුහයන් ඇතිකිරීම මගින් මෙය කල හැකිය.
- **ඒකාබද්ධ කිරීම** සිදුවන්නේ අරමුදල් ස්ථරගත කර ඒවායේ සම්භවයෙන් දුරස්කිරීමට පසුවය. ඉන්පසු මෙම අරමුදල් අපරාධකරුවන් හට නීත්‍යානුකූල අරමුදල් වශයෙන් භාවිතා කිරීම සහ පාලනය කිරීම කල හැකිවේ. මෙම පිරිසිදු මුදල් තවත් අපරාධ ක්‍රියාකාරකම්වල හෝ නීත්‍යානුකූල ව්‍යාපාරවල (සමාගම් කොටස් වැනි) ආයෝජනය, හෝ වැඩි වටිනාකම් ඇති වත්කම් (දේපළ වැනි) සහ සුඛෝපභෝගී භාණ්ඩ (මිල අධික කාර් වැනි) මිලට ගැනීම.

3.2 බහුල ලෙස කරන මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද

ඕනෑම ස්ථානයක මුදල් විශුද්ධිකරණ ක්‍රම (දර්ශවාදය) තදින්ම තීරණය වන්නේ ආර්ථිකය, මූල්‍ය වෙළඳපොල, මුදල් විශුද්ධිකරණයට එරෙහි ක්‍රියාමාර්ගයන් මතවේ. අපරාධකරුවන් විසින් මුදල විශුද්ධිකරණයට අවශ්‍ය ක්‍රමවේද නිර්මාණය කර ගැනීමට ඉතාම නිර්මාණශීලීවේ.

බහුල මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද පහත දක්වා ඇත.

විදේශ බැංකු බැංකු රහස්‍යභාවය පිළිබඳ නීති ඇති රටවල එතෙර ගිණුම් මගින් මුදල් යැවිය හැකිය. මේ මගින් නිර්නාමිකව බැංකු කටයුතු සිදුකල හැකිවේ.
මුදල් හොරෙන් ගෙනයාම මුදල් ජනනය කල අපරාධයෙන් එවා දුරස්කර තැබීමට දේශසීමා ඔස්සේ එවා භෞතිකව ගෙනයා හැකිය.
විකල්ප/අවිධිමත් ප්‍රේෂණ මාරුකිරීම ආසියාවේ තිබෙන සමහර රටවල් සතුව ලිඛිත නොවූ තැන්පතු, මුදල් ගැනීම් සහ යැවීම් කලහැකි හොඳින් ස්ථාපනයවූ, නීත්‍යානුකූල විකල්ප බැංකු ක්‍රම ඇත.
නමට පමණක් සීමාවූ සමාගම් සමහර සමාගම් නිර්මාණය කර ඇත්තේ මුදල් විශුද්ධිකරණය අරමුණ ඇතිවය. මේවා මගින් සත්‍ය වශයෙන් නොපවතින භාණ්ඩ සහ සේවා සඳහා නීතිවිරෝධී ලාභ, ගෙවීම් වශයෙන් ලබාගෙන වංචනික ඉන්වොයිසි සහ ශේෂ පත්‍ර ඔස්සේ නීත්‍යානුකූල ගනුදෙනු වශයෙන් පෙන්වයි.
ව්‍යුහගත කිරීම හෝ ස්මර්ෆින් විශාල මුදල් ප්‍රමාණ FIUහි වාර්තාකරණයට අවශ්‍ය අවම ගණනට වඩා අඩු, සැකකල නොහැකි ආකාරයේ කුඩා මුදල් ප්‍රමාණවලට බිඳීම. මෙම මුදල් ඉන්පසුව මිනිසුන් කිහිප දෙනෙක් (ස්මර්ෆ්ස්) හෝ එක් පුද්ගලයෙකු මගින් දීර්ඝ කාලයක පුරා බැංකු ගිණුම් එකක හෝ කිහිපයක තැන්පත් කරයි.
නීත්‍යානුකූල සමාගම්වල ආයෝජනය කිරීම නීති විරෝධී ලාභ, එවායේ මූලාශ්‍රය සැඟවීම සඳහා භෝජන ශාලා, මත්පැන් හල් වැනි මුදල් මත ගනුදෙනු කරන නීත්‍යානුකූල ව්‍යාපාරවල දමනු ඇත. මෙම ව්‍යාපාර භාණ්ඩ සහ සේවා සපයන ඉදිරිපස සමාගම් වන අතර එවායේ නියම අරමුණ මුදල් විශුද්ධිකරණයයි.
අධික වටිනාකම ඇති වත්කම් කලා නිර්මාණ, පුරා වස්තු, රන්ආභරණ, වටිනා ලෝහ සහ ගල්, බෝට්ටු හෝ වාහන සහ නිශ්චල දේපළ වැනි ඉහළ වටිනාකම් ඇති වත්කම් මිලට ගෙන අපරාධවලින් ලැබුණු ලාභ නැවත ආයෝජනය කරන හෝ සඟවන ක්‍රම උපයෝගී කරගනී.
වෙළඳාම පදනම්වූ මුදල් විශුද්ධිකරණය අපරාධවලින් ලද ලාභ සැඟවීමට නීත්‍යානුකූල වෙළඳාම උපයෝගී කරගත හැකිය. මෙය මුදල් විශුද්ධිකරණයේ නවීන ක්‍රමයක් වන අතර එව අතර නීති විරෝධී භාණ්ඩ එහා මෙහා ගෙනයාම, ලියකියවිලි වංචනික ලෙස සැකසීම, මූල්‍ය ගනුදෙනු වැරදි ආකාරයට පෙන්වීම, සහ භාණ්ඩවල වටිනාකම් අවතක්සේරු සහ අධිතක්සේරු කිරීම ඇත.

3.3 මිනිස් ජාවාරම් අවස්ථාවලදී මුදල් විශුද්ධිකරණය

මූල්‍ය පියසටහන්: ආසියා පැසිෆික් කලාපයේ මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමට අදාල මූල්‍ය විමර්ශන සම්බන්ධ විශ්ලේෂණයක් යන වාර්තාව වර්ධනය කලේ මාර්ගෝපදේශයේ මෙම කොටස සම්බන්ධයෙන් දැනුවත් කිරීමටවේ. වාර්තාව මගින් මිනිස් ජාවාරම ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහය සම්බන්ධ ප්‍රධාන ගෝලීය සාහිත්‍යය සහ මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමේ භාවිතා කලහැකි මූල්‍ය මෙවලම් සම්බන්ධ මෑතකාලීන ගෝලීය අත්දැකීම් සම්බන්ධ සමාලෝචනයක් සපයයි. ඒ මගින් බාලි ක්‍රියාවලි සාමාජික රටවල විෂය අධ්‍යයන ඇතුළු ප්‍රශ්නාවලිවලට දී ඇති ප්‍රතිචාර විශ්ලේශනය කරයි.

වාර්තාව මගින් පෙන්වා දෙන්නේ ගෝලීය වශයෙන් සහ ආසියා පැසිෆික් කලාපයේ මිනිස් ජාවාරම හා එයට ආශ්‍රිත මූල්‍ය ප්‍රවාහය සම්බන්ධ දත්ත සහ සංඛ්‍යාලේඛණ සීමාසහිත බවයි. මිනිස් ජාවාරම හා සම්බන්ධ මූල්‍ය ප්‍රවාහය සම්බන්ධ විමසීම් ආකාර දෙකක් ඇත: ජාවාරම්කරුවන් විසින් විශුද්ධිකරණයකල නීතිවිරෝධී මුදල් ප්‍රවාහය, සහ ජාවාරමට ලක්කල පුද්ගලයන්ගෙන් එන මුදල් ප්‍රවාහය, විශේෂයෙන්ම සිය රටවල සිටින පවුලේ අයහට යවන මුදල් සේවා භාවිතයෙන්, හෝ මිනිස් ජවාරම්කරුවන් හට ණය ගෙවීමේ අරමුණින් මුදල් යැවීම සඳහා බැංකු සේවා හෝ මුදල් යවන සේවා භාවිතය මගින්.

විශේෂයෙන්ම මිනිස් ජාවාරමට ලක්වූ අයගෙන් එන මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් දත්ත සීමාසහිතවේ. මෙම තොරතුරු ගොදුරුවූ අය අරමුණුකරගත් ප්‍රවේශයකදී ඉතාම වැදගත්වේ. එසේම විශේෂිත මිනිස් ජාවාරම්කාර ක්‍රමවේද සලකා බැලීමේදී (උදාහරණ වශයෙන්, ලිංගික උපයෝජනය) මෙය වැදගත්වේ. වර්තමාන අධ්‍යයනයන් සහ රජයේ ප්‍රකාශන මගින්ද මුදල් විශුද්ධිකරණ ක්‍රමවේද කෙරෙහි අවධානය යොමුකරන අතර, මිනිස් ජාවාරම සහ සංක්‍රමණිකයන් හොරෙන් රැගෙන එම එකම ආකාරයකට සලකනු ලබයි. මේ මගින් මෙම අපරාධවල පුළුල් විස්තරයකට යටත් ක්‍රමවේද සහ දර්ශකවලට හේතුවේ. වඩා හොඳ දත්ත සහ අපරාධ යුක්ති ප්‍රතිචාර සහ පුද්ගලික අංශයේ දායකත්වයට මාර්ගෝපදේශය ලබාදිය හැකි අවධානම් ඇගයීමේදී ඉතා වැදගත්වේ.

මූල්‍ය පියසටහන් වාර්තාව මගින් මිනිස් ජාවාරම් සොයා ගැනීම, මිනිස් ජාවාරම්කරුවන් හට සාර්ථකව නඩු පැවරීමට උපකාර කිරීම, සහ මූල්‍ය ක්‍රමය නීති විරෝධී අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට එරෙහිව ශක්තිමත් කිරීම සඳහා මහජන සහ පුද්ගලික අංශයේ හවුල්කාරිත්වය සම්බන්ධ නූතන ජාත්‍යන්තර උදාහරණ දක්වා ඇත. මෙම හවුල්කාරිත්වයන් මගින් මිනිස් ජාවාරමට එරෙහි ආරක්‍ෂාවක් වශයෙන් පුද්ගලික අංශය වඩා හොඳින් යොදා ගැනීමේ සහ විමර්ශන සහ නඩු පැවරීමට සහාය ලබාදීම සඳහා අවශ්‍ය අදාල දැනුම සහ විශේෂඥ දැනුම භාවිතයට අති හැකියාව පෙන්වයි.

බාලි කාර්‍යාවලි සාමාජික රටවලින් ප්‍රශ්නාවලිවලට ලබාගත් ප්‍රතිචාර මගින් හඳුනාගත්තේ කලාපයේ අපරාධවලින් ලබාගත් දේ සම්බන්ධ පහත මුදල් විශුද්ධිකරණ ක්‍රමවේදයන්ය:

- අඩු වටිනාකමින් යුත් ගනුදෙනු භාවිතා කිරීම (වැඩිපුර වාර්තා කිරීමේ අවශ්‍යතාවයට වඩා අඩු වටිනාකම්)
- මුදල් හෝ වටිනාකම යවන සේවා සපයන්නන් භාවිතා කිරීම
- අපරාධවලින් ලැබෙන ලාභ නීත්‍යානුකුල ව්‍යාපාර ආදායම සමඟ එක් කිරීම, සහ
- අපරාධවලින් ලැබෙන ලාභ අන් අයට පැවරීම.

ප්‍රශ්නාවලි ප්‍රතිචාරවලින් හඳුනාගත් තවත් දෙයක් වන්නේ මූලික මූල්‍ය දර්ශකය වන්නේ පුද්ගලයෙකුගේ ජීවන රටාව ඔවුන්ගේ සාධාරණ ආදායම් මාර්ගය හා නොසැසඳීමයි. මිනිස් ජාවාරම, හෝ මිනිස් ජාවාරම ආශ්‍රිත මුදල් විශුද්ධිකරණය, සොයා ගනු ලබන වඩා බහුල ක්‍රමවේදයන් වන්නේ නීතිය බලාත්මක කරන ආයතන මගින් කරන විමර්ශන, මූල්‍ය ආයතන මගින් වාර්තා කරන සැක සහිත ගනුදෙනු වාර්තා සහ ගොදුරුවූ අයගේ පැමිණිලි ආදියයි.[11]

11 Ibid 35 වන පිට

4 වන කොටසඃ මූල්‍ය බුද්ධි අංශ (FIU)

4.1 රජය මගින් මුදල් විශුද්ධිකරණ ක්‍රියාකාරකම් හඳුනා ගන්නේ කෙසේද?

FIU මගින් සඵල ආකාරයට මුදල් පසුපස හඹායාම පහසු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්‍ය භාරයක් ඉටු කරයි. යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් මගින් මුදල් විශුද්ධිකරණය කරන බවට සොයා ගැනීම සඳහා මූල්‍ය ආයතන සහ කැසිනෝ, සමාගම් සේවා සපයන්නන්, නීතීඥයන් සහ ගණකාධිකාරවරුන් වැනි වෘත්තීකයන්ගෙන් රජය වෙත තොරතුරු ලබාගැනීම අවශ්‍යවේ. මුදල් විශුද්ධිකරණයට එරෙහි සම්මතයන් මගින් කුමන ආයතන මගින් සැක කටයුතු ගනුදෙනු වාර්තා කල යුතුද යන්න දක්වයි. මේවා වාර්තා කරන ආයතනවේ. රජය, සිය FIU ඔස්සේ, වාර්තා කරන ආයතන වලින් තොරතුරු ලබාගනී. මෙම වාර්තා සැක කටයුතු ගනුදෙනු හෝ කරුණු වාර්තා ලෙස හඳුන්වයි. FIU වෙතින් මෙම තොරතුරු විශ්ලේෂණය කර, වෙනත් නීතිය බලාත්මක කරන ආයතනවලට ලබාදේ. පහත රූපසටහන මගින් FIU වෙතින් සහ ඒ වෙත තොරතුරු ගලායන ආකාරය පෙන්වයි.



රූපසටහන ලබාගත්තේ මූල්‍ය බුද්ධි අංශ වෙතිනිඃ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව, සමාලෝචනයක් 2004[12]

12 https://www.imf.org/external/pubs/ft/FIU/fiu.pdf

4.2 FIU වෙතින් කුමක් කරයිද?

සිය රටේ තත්වයට සහ අවශ්‍යතාවයට වඩාත්ම ගැලපෙන්නේ කුමක්ද යන්න මත, විවිධ රටවල විවිධ ආකාරයේ FIU ඇත. සියළු FIU හට ඇති වගකීම් වන්නේ ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, සහ මූල්‍ය බුද්ධිය බෙදා හැරීම සම්බන්ධයෙනි.

FATF මගින් FIU හට FIU හි **එග්මොන්ට් කණ්ඩායමේ** සාමාජිකත්වය ලබා ගන්නා ලෙස උනන්දු කෙරේ - FIU152 කින් සමන්විත ෙගා්ලීය ආයතනයකි.

FIU හි ක්‍රියාකාරිත්වයේ මූලික අංගයක් වන්නේ එග්මොන්ට් ආරක්ෂාකාරී වෙබ් අඩවිය (ESW) වෙතින් තෙරතුරු ලබාගෙන විදේශ රටවල් සමග සහයෝගයෙන් බෙදාහදා ගැනීමට ඇති හැකියාවයි.[13] කෙසේවුවද, FIU අතරේ තොරතුරු බොදාහදා ගැනීම මගින් ක්ෂණිකව මූල්‍ය බුද්ධිය ලබාදීමට ඉඩ ලැබෙන අතර, තොරතුරු ලබාදෙන FIU හි අනුමැතිය නොමැතිව එම තොරතුරු අපරාධ නඩු කටයුතුවලදී සාක්ෂි වශයෙන් උපයෝගී කරගත නොහැක.

FIU හට විමර්ශනයක් හෝ නඩු පැවරීමකට උපකාර කල හැකිද යන්න සලකා බැලීමේදී ප්‍රධාන වෙනස වන්නේ සමහර FIU හට විමර්ශනය සම්බන්ධ බලයක් ඇති අතර අනෙක්වා හට එම බලය නැතිවීමයි. මෙම බලයට ගනුදෙනු තහනම් කිරීම, සහ වත්කම් අල්ලා ගැනීම ඇතුලත්වේ. බොහෝ FIU වෙතින් මූල්‍ය විශුද්ධිකරණය සම්බන්ධ කර්මාන්තය දැනුවත් කිරීමේ කාර්‍යභාරයද ඉටුකරන අතර, දඩ ගැසීම සහ අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දඩ ගැසීම වැනි නියාමන බලතල යටතේ බලාත්මක කිරීම්ද සිදු කරයි.

හෝඩුවාවන්: ඔබගේ FIU සමග ක්‍රියාශීලී සම්බන්ධතාවයක් ප්‍රවර්ධනය කිරීම

- ඒජන්සි අතර නිතිපතා තොරතුරු බෙදාහදා ගැනීම උනන්දු කිරීම.
- තොරතුරු සහ අත්දැකීම් සම්බන්ධ දෙආකාර හුවමාරුවක් සඳහා ඔබගේ FIU හි දුර සිට කටයුතු කරන නිලධාරීන් සහ ඇතුලේ සිට කටයුතු කරන නිලධාරීන්ව ඔබගේ විමර්ශන ඒජන්සියේ හෝ විශේෂඥ කණ්ඩායම් සඳහා සලකා බැලීම හෝ එයට ප්‍රතිවිරුද්ධ දෙය සලකා බැලීම.

4.3 ඔබගේ විමර්ශණයට FIU වෙතින් කෙසේ උපකාර කල හැකිද?

මිනිස් ජාවාරම සම්බන්ධ විමර්ශන සහ නඩු පැවරීම්වලට සහාය ලබාදීම සඳහා FIU මගින් වටිනා තොරතුරු සහ උපකාර ලබාදිය හැකිය. පහත ඇත්තේ FIU වෙතින් ලබාදිය හැකි උපකාර ලැයිස්තුවකි. ඔබගේ රටෙහි ඇති FIU හි ආකෘතිය අනුව ඒ මගින් ඔබට ලබාදිය හැකි උපකාර වෙනස් වනු ඇත. FIU වෙතින් පහත ආකාරයට **විමර්ශන** උත්සාහයන්ට සහාය ලබාදිය හැකිය.

- මුදල් විශුද්ධිකරණය සහ අපරාධ ක්‍රියාකාරකම් කරන බවට සැක කරන පුද්ගලයන් සහ ආයතන අතර සම්බන්ධතා ස්ථාපනය කිරීමට **මූල්‍ය බුද්ධි වාර්තා** සැකසීම.
- සැකසහිත ගනුදෙනු වාර්තා, මුදල් ගනුදෙනු වාර්තා, දේශසීමා හරහා යනු මුදල් වාර්තා, සහ වෙනත් අදාල තොරතුරු සම්බන්ධ **මූල්‍ය තොරතුරු** ලබාදීම. මේ මගින් ඔබට **අපරාධ වැරදිකරුවන් හඳුනාගත හැකි අතර,** දැනට පවතින විමර්ශනවලට සහාය ලබාදීම හෝ අළුත් නඩු කටයුතු ඇරඹීම කල හැකිය.
    - **සැකසහිත මූල්‍ය ගනුදෙනු කල් ඇතිව හඳුනා ගැනීම** මගින් අපරාධ කටයුතු සිදුවීම වළක්වා ගත හැකිවේ. උදාහරණ වශයෙන් ත්‍රස්තවාදී කටයුතුවලදී, හෝ මිනිස් ජාවාරම් කරුවෙකු හට මුදලක් ගෙවීම ආදී දැනට අපරාධ වරදක් සිදු වෙමින් පවතින බවට විස්තර ඇති අවස්ථාවලදී.
- **සමහර අධිකරණ බල ප්‍රදේශවල, ගිණුම් තහනම්කර වත්කම් තහනම් කිරීමේ හැකියාව ඇත,** තවත් සමහර අවස්ථාවල **යම් කාලයකට ගනුදෙනු අවහිර කල හැකිය.** මේ මගින් සිද්ධාන්තයක් තහවුරු කිරීමට කටයුතු කරන අතර තව දුරටත් විමර්ශන සිදු කිරීමට කාලය ලබාගෙන අරමුදල් සුරක්ෂිත කිරීමට හැකිවේ.
- **විමර්ශනයක් සිදු කිරීමට මූල්‍ය විශේෂඥතාවය ලබාදීම** - උදා. මූල්‍ය සාක්ෂි විමර්ශනය කිරීමට ඔබගේ FIU වෙතින් වෝහාරික ගණකාධිකාරයෙකු ලබාදිය හැකිය, සමහර අවස්ථාවල, නඩු කටයුතුවලදී උපකාර කිරීමට.

13 මූල්‍ය බුද්ධි අංශය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල-ලෝක බැංකුව, සමාලෝචනයක් 2004. http://www.egmontgroup.org/about/financial-intelligence-units-fius
එග්මොන්ට් කණ්ඩායමේ සාමාජික රටවල් සම්බන්ධ ලැයිස්තුවක් සඳහා බලන්න https://www.egmontgroup.org/en/membership/list

- සිය විදේශ සම පාක්ෂය ඔස්සේ **ජාත්‍යන්තර තොරතුරු හුවමාරු කර ගැනීම පහසු කිරීම.** උදාහරණ වශයෙන්, සමහර FIU හට විදේශ නීති බලාත්මක කරන ඒජන්සි සමඟ තොරතුරු හුවමාරු කිරීමට බලය ඇති අතර සමහර FIU හට ඉන්ටර්පෝල් සහ යුරෝපෝල් ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමට බලය ඇත.
- සමහර අවස්ථාවල, ඔබගේ රාජ්‍යයේ FIU තත්වය අනුව, FIU වෙතින් **සත්‍ය වශයෙන් විමර්ශනය පැවැත්විය හැකි අතර, නැතිනම් හවුල් කාර්ය සාධක බලකාය වෙත සහභාගිවිය හැකිය.**

හෝඩුවාවන්

ඔබට උපකාර කල හැකි ආකාරය හඳුනා ගැනීම සක්ෂි හා විමර්ශනයේ මුල් අවස්ථාවල ඔබගේ FIU සමඟ සම්බන්ධ විය හැකිය.

හෝඩුවාවන්

ඔබගේ සැකයද, FIU දත්ත පද්ධතියේ දැනටමත් වාර්තා කර තිබිය හැකිය. ඔබගේ සැකකරු දැනටමත් විදේශ රටකට ගොස් ඇති අවස්ථාවක විදේශ රටකට හෝ විදේශ රටකට මුදල් යවා හෝ විදේශ රටකින් මුදල් ගෙන්වා ගෙන ඇති අවස්ථාවල කරන ඉල්ලීම් ඇතුළුව, ලබාගත හැකි වාර්තා සම්බන්ධ ඉල්ලීම් FIU වෙත යැවීමට සලකා බලන්න.

පහත ආකාරයට FIU වෙතින් ඔබගේ **නඩු පැවරීමේ** උත්සාහයන් හට උපකාර කල හැකිය:

- මූල්‍ය තොරතුරු හිඩැස් ඇති අවස්ථාවල අභිචෝදකයන් හට උපකාර කිරීම සඳහා **විමසීම් භාර ගැනීම.**
- සංකීර්ණ මූල්‍ය ගනුදෙනු පැහැදිලි කිරීම ඇතුළුව, නඩු පැවරීම්වලට උපකාර කරන **විශේෂඥ මූල්‍ය උපදෙස් ලබාදීම.**

වැළැක්වීමේ උත්සාහයන් හට උපකාර කිරීමට FIU වෙතින් පහත උපකාර ලබාදිය හැකිය:

- **බුද්ධිමය නිෂ්පාදන** ඇතිකිරීම. මේවා අතරට විදේශවලින් සමාන නිපුණතා ඇති අය, අධිකරණ බල සීමා හරහා තොරතුරු ඉක්මණින් හුවමාරුකරන FIU සිටFIU හට ඇති ජාල මෙයට ඇතුලත්වේ (බොහෝ අවස්ථාවල අන්‍යෝන්‍ය නීති උපකාර හෝ දූත මාර්ගවලට වඩා වේගයෙන් සිදුවේ).
- **දර්ශවාදී වාර්තා** නිර්මාණය කිරීම සහ යම් අපරාධයක දර්ශකයන් වන ගිණුම්වල මූල්‍ය ගනුදෙනු සහ ලක්ෂණ හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම. මේ මගින් නීතිය බලාත්මක කරන සහ වාර්තා කරන ආයතන විසින් සිදු කරන වැළැක්වීමේ සහ විමර්ශනය කිරීමේ උත්සාහයන් සම්බන්ධව දැනුම්දීම මගින් උපකාර කල හැකිය.
- **පුහුණු කරන කාර්ය මණ්ඩලය** විසින් කරන සැකකරන ගනුදෙනු සම්බන්ධයෙන් වාර්තා කරන ආයතන වෙත දැනුම්දීම.
- අධ්‍යාපන සහ නියාමන අවශ්‍යතාවයන් බලාත්මක කිරීම සම්බන්ධ ක්‍රියා මාර්ග ඔස්සේ **කර්මාන්ත දැනුවත් කිරීමේ වැඩසටහන්** ලබාදීම මගින් කර්මාන්ත AML අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම.

4.4 විෂය අධ්‍යයනය

පසුබිම

2016 අප්‍රියෙල් මාසයේ, මැලේසියාවේදී මියගිය ටිමෝර්-ලෙස්ටි හි සංක්‍රමණික සේවකයන් තුන් දෙනෙක් සම්බන්ධයෙන් ඉන්දුනීසියානු ජනතාවගේ අවධානය යොමුවිය. එක් සේවකයෙකුගේ පවුලේ අය, ඇය 2015 සැප්තැම්බර් 2 අතුරුදහන් වුණු පසු විදේශයක වැඩකරන බව දැන සිටියේ නැත. නැගෙනහිර නුසා ටෙන්ගාරා (NTT) යනු සේවකයන් විදේශවලට යවන ඉන්දුනීසියාවේ 9 වන විශාලතම ප්‍රාන්තයවේ. එසේම ඉන්දුනීසියාවේ වැඩිපුරම සංක්‍රමණ සේවකයන් මියයන ප්‍රදේශය මෙයවේ. 2015 සහ 1016 අතර ගණන් බලා ඇති ආකාරයට NTT මිනිසුන් 4144 ක් විදේශවලට යවා ඇත. ගණන් බලා ඇති ආකාරයට 2015 සිට 2017 කාලයේදී NTT සංක්‍රමණ සේවකයන් 99 ක් මියගොස් ඇත. ඉන්දුනීසියානු ජනාධිපති විසින් ඉන්දුනීසියානු පොලීසිය හට මෙම ගැටළුව විමර්ශනය කිරීමට උපදෙස් ලබා දෙන ලදී. මෙයට පිළිතුරු වශයෙන් මිනිස් ජාවාරම් කාර්‍ය සාධක බලකායක් ස්ථාපනය කල අතර කුපාන්ග් හි දිස්ත්‍රික් පොලිස් ප්‍රධානියා හට මෙම නඩුව විමර්ශනය කරන ලෙස විධානය කරන ලදී. විමර්ශනය අවස්ථාවේ, ඉන්දුනීසියාව සහ මැලෙසියාව පුරා ව්‍යාප්තව ඇති මිනිස් ජාවාරම් ජාල 12ක් හඳුනාගන්නා ලදී.

මුදල් ප්‍රවාහය

2015 ජනවාරි සිට 2016 අගෝස්තු කාලය පුරා, ජාලය මගින් සංක්‍රමණ සේවකයන් 2279 ක් සාර්ථකව මැලේසියාව වෙත යවා ඇත. ෙ මම මිනිසුන් රැගෙන යාම හේතුවෙන් ජාලය විසින් ලබාගත් ගනුදෙනුවල මුළු වටිනාකම US$563,446.00 ක්වේ. ලබාගත හැකි මූල්‍ය ගනුෙ දනු දත්ත අනුව, එල්ටාරි ගුවන්තොටුපලේ නීති විරෝධී එජන්තව කළමණාකරණය කල අපරාධකරු 2015 ජනවාරි 1 සිට 2016 අගෝස්තු 8 දක්වා කාලය අතරතුර US$244,125.69 ක මුදලක් ලබාගෙන ඇත. මෙය මැලේසියාව, සිංගප්පූරුව, හොංග් කොන්ග් සහ සවුදි අරාබියට මිනිසුන් 1787 ක් යැවීම ඇතුළුවන අතර එහි දරුවන් 48 ක්ද සිට ඇත.



ඉන්දුනීසියානු මූල්‍ය බුද්ධි අංශය වන PPATK මගින් සැකසහිත ගනුදෙනු වාර්තා 64 ක් විශ්ලේෂනය කල අතර ඒ මගින් පහත ඇති දේ ෆ පන්වාදී ඇත:

- කුපන්ග් දිස්ත්‍රික් පොලීසිය විසින් කල විමර්ශනවලදී පාර්ශවයන් 48 ක් සම්බන්ධයෙන් මිලියන US$13.5 ක මුදලක් ගෙවා ඇත.
- NTT හි ක්‍රියාත්මක වන මිනිස් ජාවාරම් ජාල සමඟ ඇති සම්බන්ධතා.
- නැගෙනහිර නුසා ටෙන්ගරා හි මිනිස් ජාවාරම කරන අයට අරමුදල් සපයන අයව සොයා ගැනීමට විශ්ලේෂණය මගින් හැකිවිය.
- විශ්ලේෂණයේදී විමර්ශකයන් හට මුදල් පසුපස හඹායාම යන ප්‍රවේශය අනුව සිතියම් ඇඳීමට සහාය ලබා දුනි.

අනතුරු හැඟවීම්			
අංකය	අනතුරු හැඟවීම් දර්ශකය	විචල්‍යය	උදාහරණ
1	සේවාදායක පැතිකඩ	පුද්ගලික අංශ	• හිමිකරුවන්/ PPTKIS හි සේවකයන් (නීත්‍යානුකූල සහ නීති විරෝධී යන දෙකොටසම) • මුදල් මාරුකරන්නන් • හිමිකරුවා/ගමන් ව්‍යාපාරවල සේවකයන් • ගුවන් සේවා • ගැල්/ප්‍රවාහන සේවා • කුලී සේවා
		රාජ්‍ය අංශය	• සංක්‍රමණ නිලධාරීන් • ගුවන් සේවා ආරක්ෂකයන් • මිලිටරි පුද්ගලයන් • පොලිස් නිලධාරීන්
2	යටින් දිවෙන ගනුදෙනු	මූලික පද	දරුවන්/දරුවා, මිනිසුන්, ප්‍රවේශපත්‍ර, ආහාර දීමනාව, ගෘහ සේවිකාවන්, ගමන් බලපත්‍ර ගාස්තු, අවිවාහක ස්ත්‍රීන්, RM, ගාස්තු ගෙවන්න, ළමුන්ට ගෙවන වේතන ආදිය.
3	ගනුදෙනු මාර්ගය	බැංකු පද්ධතිය	• වැඩිපුර වෙන්කිරීම • ඒ.ටී.එම්. (ATM) ඔස්සේ මුදල් යැවීම • IB/MB ඔස්සේ සිදුවන ගනුදෙනු • ටෙලිග්‍රැෆික් හුවමාරු
4	ගනුදෙනු කරන ආකාර	එකට මිශ්‍රවීම	PPATKIS හිමිකරුවන්/සේවකයන්ගේ ලෙස හැඳින්වෙන විවිධ පාර්ශවයන්ෆ ෆ් ගිණුම්වල සොයාගත හැකි නීත්‍යානුකූල ව්‍යාපාරවලින් ලැබෙන ලාභ සහ අපරාධවලින් ලැබෙන මුදල්. අපරාධවලින් ලැබෙන මුදල්වල සම්භවය/සඟවන බවටවූ හැඟවීමකි.
5	මූල්‍ය ගනුදෙනු විශ්ලේෂණය මගින් මිනිස් ජාවාරම් ක්‍රියාකාරකම් අදියරවල ක්ෂේත්‍රයේ සේවකයන් බඳවා ගැනීම, නවාතැන් ලබාදීම, මව්බිමේ සිට සංක්‍රාන්ති සහ ගමනාන්ත නගර, රටවල් දක්වා ගමන්, ලියවිලි ව්‍යාජ ලෙස සකස් කිරීම, සිට රජයේ ආයතන වෙත අල්ලස් ලබාදීම සම්බන්ධ චෝදනා දක්වා කටයුතු ගලපා ගැනීමට දායක විය. විමර්ශන මගින් ගිණුම් හිමියන්ගේ පැතිකඩවල් සම්බන්ධ තොරතුරු, ගනුදෙනුවේ දිනය, ගනුදෙනු කල ප්‍රමාණය, සහ ගනුදෙනුව සිදුවුනු ස්ථානය ගලපන ක්‍රමවේදය අදාල කර ගන්නා ලදී.		

ප්‍රතිඵල

කුපාන්ග් දිස්ත්‍රික් පොලීසියේ විමර්ශකයන් විසින් ජාල 11 ක් අකර්මන්‍ය කල අතර සැකකරුවන් 32 ක් හඳුනාගෙන ඇත. සැකකරුවන් 32 න් සැකකරුවන් 11 දෙනෙකු අධිකරණය මගින් මිනිස් ජාවාරම් කිරීමේ වරදට වැරදිකරුවන් කරන ලදී. ඔවුනට වසර 2 සිට 9 දක්වා සිරදඬුවම් නියම කරන ලදී. අධිකරණ මගින් US$9,230.00 සිට US$153,800.00 අතර දඩ නියම කර ඇත. ගොදුරුවූ අය සහ ඔවුන්ගේ පවුල්වල අයට US$77.00 සිට US$4,230 දක්වා වන්දි ලබාදී ඇත. ගුවන් තොටුපල සංක්‍රමණ නිලධාරියෙකු හට මෙම මිනිස් ජාවාරම් නඩුවේදී වසර 4 ක සිර දඬුවමක් ලැබුණු අතර US$15,300.00 ක දඩයක්ද, US$77,00 වන්දියක් ගොදුරුවූ අයගේ පවුලට ගෙවීමත් සිදුවිය.

5 වන කොටස: විමර්ශන

5.1 මූල්‍ය විමර්ශණය යනු කුමක්ද?

මූල්‍ය විමර්ශනයක් යනු අපරාධ නඩුවක සැකකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකුගේ මූල්‍ය ඉතිහාසය සහ ක්‍රියාකාරකම් සම්බන්ධ විවිධ ආකාරයේ මූලාශ්‍ර සම්බන්ධ තොරතුරු බුද්ධිමය දත්ත සහ සාක්ෂි රැස් කිරීමවේ. මූල්‍ය විමර්ශනයකදී අපරාධයකට අදාල සියළුම මූල්‍ය අංග දෙස බැලීම සිදු කරයි. මේවා අතරට, අපරාධය කිරීමට සූදානම්වීම සහ අපරාධය කරන අතරතුරු ආයෝජනය කල මුදල්, අපරාධය සිදු කරන විට ඒ සඳහා ගිය වියදම්, අපරාධය හේතුවෙන් ගෙවන ලද මුදල් සහ ලැබුණු ලාභ ඇතුලත්වේ.

මුදල් විශුද්ධිකරණයේ ඕනෑම අවස්ථාවක මූල්‍ය ක්‍රියාවලිය අදාල කරගත හැකිවේ. මූලික අවශ්‍යතාවය වන්නේ මුදල් සමඟ කටයුතු කල අය **අදාල මුදල ජනනය වූයේ අපරාධයකින් හෝ අපරාධයක් කිරීම සඳහා භාවිතා කිරීමට අරමුණු කරගත් බව දැනගෙන සිටීම** හෝ දැනගෙන සිටිය යුතුවීමවේ. විවිධ තොරතුරු මූලාශ්‍ර එක ස්ථානයකට ගෙන එම මගින් සැක සහිත හෝ අසාමාන්‍ය ක්‍රියාකාරිත්වය අනුමිත කිරීම මගින් මෙය සිදුකල හැකිය.

හෝඩුවාවන්

මූල්‍ය විමර්ශනවල මූලික අරමුණු වන්නේ අපරාධයක් සිදුකරන අතර **මුදල් එහා මෙහා යාම** හඳුනා ගැනීම සහ වාර්තා කිරීම, සහ අපරාධයට සම්බන්ධ වෙනත් හවුල්කරුවන් සහ අපරාධයෙන් ලැබෙන ලාභ හඳුනා ගැනීමවේ. මුදල් පැමිණෙන්නේ කොහින්ද, කා විසින් එම මුදල් ලබා ගනීද, ලැබෙන වේලාව, සහ ලැබෙන මුදල් ගබඩා කර තබන ස්ථානය මගින් **අපරාධ ක්‍රියාකාරිත්වය සම්බන්ධ සාක්ෂි ලබාදේ.**

5.2 මුදල් එහා මෙහා ගිය ආකාරය සහ ගිය ස්ථානය පෙන්වන්නේ කෙසේද?

මුදල් ඇතුලත් සිදුවීම් මාලව හා සම්බන්ධ හෝ පෙන්වන ඕනෑම වාර්තාවක් වැදගත්වේ. බොහෝ රටවල් තවදුරටත් මුදල් පදනම්වූ ආර්ථිකයන් වශයෙන් පවතින අතර, මිනිසුන් වැඩි වැඩියෙන් ඉලෙක්ට්‍රොනික් බැංකු ක්‍රමය, වයර් ට්‍රාන්සර් ක්‍රමය, බැංකු කාඩ්පත් සහ ඉන්ටර්නෙට් මගින් බැංකු කටයුතු කිරීම සිදු කරන අතර ඒවා මගින් යම්කිසි සොයා ගත හැකි දෙයක් ඉතිරි කෙරේ. කෙසේවුවද, මුදල් පදනම්වූ ගනුදෙනුවලදී වුවද, වාර්තාවක් ඇති කරනවා විය හැකිය. මේවා අතර ඉන්වොයිස්, ගිවිසුම්, රිසිට් පත් හෝ පොත් හෝ ගිණුම් ආදිය ඇත. මෙම ගනුදෙනුවල ස්වරූපය ඉලෙක්ට්‍රොනික හෝ අනෙක් ආකාරයේ වුවද, ඒවා ආශ්‍රිත වාර්තා මගින් ගවේශකයන් හට අවසානයක් නැති තොරතුරු හෝ සාක්ෂි සපයයි.

තොරතුරු මූලාශ්‍රය, මුදල් එහා මෙහා ගිය ආකාරය සම්බන්ධ බුද්ධිමය දත්ත හෝ සාක්ෂි, හෝ මුදලේ වටිනාකම, විමර්ශනයේ ස්වරූපය මත වෙනස්වේ. කෙසේ වෙතත්, බොහෝ විමර්ශනවලදී, පොදු සම්පත් ගණනාවක් නිතිපතා උපයෝගී කර ගනි. ඒවාට පහත දේ ඇතුලත්වේ:

- සැකකරු (සාක්කුවේ තිබුණු දේවල්)
- ප්‍රවාහනය/රැගෙන ගිය නෞකාව
- වෙනත් ව්‍යාපාර සහ වෘත්තීන්
- ජංගම දුරකථන
- මූල්‍ය ආයතන
- උපයෝගීතා
- රක්ෂණ සමාගම්
- වාහන ලියාපදිංචි කරන දෙපාර්තමේන්තු
- ණය ඒජන්සි
- ඉඩම් ලියාපදිංචි කාර්යාලය
- විශ්‍රාම වැටුප් ගෙවනනන්
- බදු අධිකාරීන්/සමාජ රක්ෂණ
- රජයේ ලේඛණාගාර සහ අධිකාරී
- ගුවන් යානා සමාගම් ෆ්‍රීකුවන්ට් ෆලයර් සහ හෝටල් සාමාජිකත්ව කාඩ්පත් වැනි ලෝයල්ටි කාඩ්පත්

සම්පත් තුනක් ඉස්මතුකර පෙන්වීම වැදගත්වේ: (1) මූල්‍ය ආයතන, ඔවුන් තොරතුරු මූලාශ්‍ර සඳහා වඩාත්ම උපයෝගී කරගන්නා දෙයවීම, (2) උපයෝගීතා බිල්පත්, සහ (3) ලෝයල්ටි කාඩ්පත්, මේ මගින් වටිනා තොරතුරු ලබාදුන්නද, අවශ්‍ය තරමට භාවිතා නොවේ.

මූල්‍ය ආයතන

මූල්‍ය ආයතනවලින් ලබාගත් තොරතුරු අතරට ගිණුම් විවෘත කිරීමේ වාර්තා (හඳුනා ගැනීම සඳහා දුන් හඳුනා ගැනීම්, රැකියාව සහ ප්‍රකාශිත ආදායම ප්‍රයෝජනවත්වේ) සමග ගිණුම සම්බන්ධ සම්පූර්ණ ඉතිහාසය ඇත. හර, බැර සහ ශේෂය ඇතුලත් බැංකු ප්‍රකාශන සමග චෙක්පත්, ණය වවුචර, සහ වෙනත් ගනුදෙනු ලියකියවිලි සහ ගිණුම පවත්වාගෙන යාමේදී බැංකු නිලධාරීන් විසින් ලියන ලද සටහන්. ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ්පත් භාවිතය සම්බන්ධයෙන් මේවා සිදුවන ස්ථාන සොයා ගැනීම මගින් අදාල පුද්ගලයා ගිය ස්ථාන සොයාගත හැකිවේ, ඔවුන් ආහාර ගත් භෝජන ශාලා, ඔවුන් මිලට ගත් දෙවල්, ඔවුන් නිතර යන ස්ථාන, සහ ඔවුන් යන ක්ලබ් සහ වෙනත් සාමාජීය ස්ථාන. මේ මගින් ඔවුනට ඇති වෙනත් ගිණුම් නිරාවරණය කර ගත හැකි අතර ඔවුන් හා එක්ව කටයුතු කරන අයව හඳුනා ගැනීම හෝ ඔවුන්ව බැහැර කිරීම කල හැකිය, එසේම, වියදම් ගණනය සහ ජීවන රටා, සහ වෙනත් අපරාධ සහායකයන් හඳුනා ගැනීම කල හැකිය. නියම අවස්ථාවල ප්‍රවේශවුණු විට, අදාල පුද්ගලයන් සිටින ස්ථානද සොයා ගත හැකිය.

උපයෝගීතා බිල්පත්

නේවාසික තත්වය තහවුරු කරනවාට අමතරව, උපයෝගීතා සමාගම් වෙතින් කරන විමසීම් මගින් කලින් පැවති නොදන්නා ගිණුම් නිරාවරණය කරගත හැකිය, නැතිනම්, එම සේවා සඳහා ගෙවන වෙනත් සහායකයන් සොයාගත හැකිවේ. එම ආකාරයටම, ඉන්ටර්නෙට් සහ දුරකථන සේවා සපයන්නන් මගින්ද, උනන්දුව ඇති වෙනත් අය සහ වෙනත් අපරාධ සහායකයන්ව සොයා ගැනීමට තුඩුදිය හැකිය.

ලෝයල්ටි කාඩ්පත්

වන් වර්ල්ඩ්, අලයන්ස් හෝ ස්කයි ටීම් ආදී ගුවන් යානා ෆ්‍රීකුවන්ට් ෆ්ලයර් සාමාජික කාඩ්පත් හෝ හිල්ටන්, ස්ටාර්වුඩ් හෝ මැරියට් හෝටලය වැනි හෝටල් වලින් ලබාදෙන ලෝයල්ටි කාඩ්පත් මගින් වැදගත් තොරතුරු ලබාගත හැකිය. මේවා අතරට, පාරිභෝගික පැතිකඩ, ඔවුන්ගේ නම, ලිපිනය, ඊමේල් සහ දුරකථන අංකය, සහ සේවා සඳහා ගෙවීම සිදුකල බැංකු/ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම් ඇත. ගමන් කල ගුවන් යානා තොරතුරු සම්බන්ධ විස්තර, ගිය හෝටල් අදාල අය සමග ගිය වෙනත් අය ද මේවාට ඇතුලත්වේ.

හෝඩුවාවන්

ඔබගේ සැකකරුවන්, සිය පවුලේ සාමාජිකයන් හෝ සමීප පුද්ගලික සහ ව්‍යාපාර සහායකයන්ගේ අනන්‍යතාවය යටතේ මුදල් සඟවා ගන්නවා විය හැකිය. ඔබගේ සෙවුම් අතරට මෙම අයවද ඇතුලත් කරන්න, ඔවුන් මුදල් තබා ගැනීම හෝ සැකකරුවන් වෙනුවෙන් මුදල් එහා මෙහා කිරීම සිදුකල හැකිය.

5.3 තොරතුරු සහ සාක්ෂි රැස් කිරීම

සමස්ථ මිනිස් ජාවාරම් විමර්ශනවල කොටසක් වශයෙන් සමාන්තර මූල්‍ය විමර්ශන ස්ථාපනය කිරීම හොඳ පුහුණුවකි. විමර්ශකයන්, FIU සහ අභිචෝදකයන් අතර සම්බන්ධීකරණය මගින් මිනිස් ජාවාරම සම්බන්ධ අපරාධ විමර්ශනවලදී අමතර වටිනාකමක් ලබාදේ. එසේම, ඔබගේ රටට මුදල් විශුද්ධිකරණය සම්බන්ධ ජාත්‍යන්තර සම්මතයන් සපුරාලීමට හැකිවේ.

හෝඩුවාවන්

මිනිස් ජාවාරම සම්බන්ධ සියළු විමර්ශනයන් සම්බන්ධයෙන් **සක්‍රිය, සමගාමී මූල්‍ය විමර්ශනයක්** වර්ධනය කර ගන්න. ඔබ විසින් ලබා ගන්නා සාක්ෂි සාධනීය අපරාධය සනාථ කිරීමට උපකාර කරගත හැකි අතර, මුදල් ජාවාරම සම්බන්ධ වෙනමම වරදක් ස්ථාපනය කල හැකිවේ.

විමර්ශනයකදී ඔබගේ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිවල කොටසක් වශයෙන් **මූල්‍ය විමර්ශන සෝදිසි ලැයිස්තුවක්** ඇතුලත් කර ගැනීම මගින් මෙය ලබාගත හැකිය.

හෝඩුවාවන්

අපරාධ වැරදි සම්පූර්ණ වශයෙන් විමර්ශනය කරන බවට සහතික වීම සඳහා ඔබගේ ප්‍රතිචාරයට **අදාල සියළුම ඒජන්සිවල විශේෂඥතාවය** (විමර්ශකයන්, FIU, සහ අභිචෝදකයන්) එක් තැනකට රැගෙන එන බවට වගබලා ගන්න.

තොරතුරු විවෘත හෝ සංවෘත මූලාශ්‍රවලින් ලබාගත හැකිය. මෙම මූලාශ්‍ර අතර ඉන්ටර්නෙට් සහ සමාගම් හෝ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වාර්තා (විවෘත) හෝ මූල්‍ය ආයතන හෝ බුද්ධි වාර්තා (සංවෘත) ඇත.

සියළුම නඩු කටයුතුවලදී, තොරතුරුවලට ප්‍රවේශවන විට, විමර්ශකයන් විසින් සිය දේශීය නෛතික රාමුව තුල ක්‍රියාත්මක වියයුතු අතර සිදු කරන විමර්ශනයට අනුපාතික, නීත්‍යානුකූල, වගකිවයුතු සහ අවශ්‍ය බවට (PLAN) සාධාරණීකරණය කල හැකි විය යුතුය. විමර්ශකයන් හට ඇති ආක්‍රමණශීලී බලතල හේතුවෙන් ඔවුන් හට සේවාදායක රහස්‍යබව සහ අදාල පුද්ගලයාගේ පුද්ගලිකත්වයට ඇති මූලික අයිතිය උල්ලංඝනය වීමට ඉඩකඩ ඇති බැවින් මෙම කරුණු වැදගත් කරුණුවේ.

හෝඩුවාවන්: ඔබගේ විමසීම් පහත අවශ්‍යතාවයන් සපුරාලිය හැකි බවට වග බලා ගන්න:

- **සමානුපාතිකබව**
  - ක්‍රියාව තර්ජනයට සමානුපාතිකද?
  - එකම අරමුණ කරා ලඟාවීමට වඩා අඩු ආක්‍රමණශීලි ක්‍රමයක් තිබේද?
- **නීත්‍යානුකූලබව**
  - ක්‍රියාව සඳහා නීත්‍යානුකූල පදනමක් තිබේද?
  - මානව හිමිකම්, පුද්ගලිකතාව, දත්ත ඇතුළු නෛතික වගකීම් හා අදාල ක්‍රියාව අනුකූලද? ආරක්ෂණ සහ රහස්‍යබව සම්බන්ධ අවශ්‍යතා සපුරාලයිද?
- **වගකිවයුතුබව**
  - තීරණ වගකිව යුතු ආකාරයට රැගෙන තිබේද?
- **අවශ්‍යතාවය**
  - අදාල ක්‍රියාව අවශ්‍යද?
  - තොරතුරු විමර්ශනයට සැලකිය යුතු ආකාරයක වටිනාකමක් තිබේද?

කොතරම් සරල වුවද, මූල්‍ය විමර්ශනයකදී විෂය කළමණාකරණ ක්‍රම කාර්යක්‍ෂමව භාවිතා කිරීම අත්‍යාවශ්‍යවේ. බොහෝ අවස්ථාවල ලබාගනු ලබන තොරතුරු ප්‍රමාණය සැලකිල්ලට ගත යුතුය. ලබාගනු ලබන තොරතුරු මොනවාද සහ එවා පැමිණෙන්නේ කොහෙන්ද යන්න පැහැදිලි වාර්තා තබා ගැනීම විමර්ශනයේ පසු අවස්ථාවලදී සහ නඩු විභාගයේදී ඇතිවිය හැකි දුෂ්කරතා ඉවත් කිරීමට හේතුවේ. යම් ආකාරයක ප්‍රතිපත්තියක් හෝ තීරණ වාර්තා තිබීම මගින් පසු අවස්ථාවකට වගකීම පැවරුණු විට සමහර යම් ආක්‍රමණශීලී ක්‍රියා ගත්තේ ඇයිද යන්න විමසන විට උපකාරවේ.

⚠ අනතුරු හැඟවීම

දුර්වල ලේඛණ කළමණාකරණය හේතුවෙන් ලියකියවිලි තහනමට ලක්කල අවස්ථාවල එම තහනමට ගැනීමේ නීත්‍යානුකූල පදනම පෙන්වීමට නොහැකිවීම මගින් බොහෝ නඩු කටයුතු පරාජයවී ඇත.

හෝඩුවාවන්

ඔබගේ විමර්ශනය පුරා ලබාගනු ලබන මූල්‍ය තොරතුරු සොයා ගැනීම සඳහා විෂය කළමණාකරන ක්‍රමයක් භාවිතා කරන්න.

හෝඩුවාවන්

ඔබ විසින් තහනම්කර ගනු ලබන ලියකියවිලි වෙන වෙනමම නම්කර වාර්තාකර, අත්පත් කල දේපළ වාර්තාවක තබාගෙන, භාරකාරත්වය පැවති ආකාරය වාර්තාගත කර ආරක්‍ෂාකාරී ස්ථානයක තබා ගන්න.

5.4 විෂය අධ්‍යයනය

මේ ජේ කිම් ඕස්ට්‍රේලියාවේ මූල්‍ය විශුද්ධිකරණය සම්බන්ධයෙන් වරදකරුවෙකු කර ඇති අතර ගණිකා වෘත්තියෙන් උපයන මුදලින් ජීවත්වේ

මේ ජේ කිම් අග්නිදිග ආසියාවෙන් හොඳ වැටුප් සහ සේවා කොන්දේසි ලබාදෙන පොරොන්දුව මත කාන්තාවන් 100 දෙනෙකුට අධික ප්‍රමාණයක් ලිංගික සේවකයන් වශයෙන් සේවයේ යෙදවීමට මෙල්බර්න් නුවරට ගෙනවිත් එවායෙන් ලැබෙන ආදායමින් ඇය සුඛෝපභෝගී ජීවිතයක් ගතකරන ලදී. ඇය හට ලිංගික සේවකයන් යොදාගෙන කරන ව්‍යාපාරයක් කිරීමට හෝ එයින් ආදායමක් ලබා ගැනීමට හෝ බලපත්‍රයක් නොතිබුණද, ඇය එසේ කටයුතු කරන ලද. ලිංගික සේවකයන් පාලනය කිරීම සඳහා කිම් විසින් බලපත්‍ර නැති ඕවර්සියර්වරයන් පත්කල අතර කිම් ඔවුන් සමග රැස්වීම් පවත්වන ලදී. තවද කාන්තාවන් විසින් කරන වැඩ ප්‍රමාණය වැඩිකර ගන්නා ආකාරය සාකච්ඡා කල අතර අඩුවෙන් වැඩ කිරීම සම්බන්ධයෙන් දඩ නියම කරන ලදී. පොලීසිය විසින් විමර්ශනය කරන අවස්ථාවේ අය සතුව ව්‍යාජ නම්වලින් ජංගම දුරකථන 12 ක් තිබිණි. උපයන මුදල් රැස් කිරීම සහ වැඩමුර සැකසීම ඇතුළු ලිංගික සේවකයන් සම්බන්ධ වැඩකටයුතු සම්බන්ධයෙන් කිම් සමග එකට වරද සිදුකල අය ඇයට උපකාර කරන ලදී. සේවකයන් හට කරන ලද ගෙවීම් සාරාංශ මගින් ඇයගේ අපරාධවලින් ඇය ඉපයූ මුදල ගණනය කිරීමට පදනම සකස් කල අතර ප්‍රතිඵලය වූයේ AU$2,509,000.00 ක මූල්‍ය දණ්ඩන නියමයකට යටත් කිරීමවේ.

මුදල් පසුපස ලුහුබැඳ යාම මගින්, ගණිකා මඩම් කළමණාකරණය සහ ගණිකා මඩම් ක්‍රියාත්මක කිරීම සඳහා මිනිස් ජාවාරම සම්බන්ධයෙන් ඍජුවම කිම් කටයුතු කල බව විමර්ශකයන් විසින් පෙන්වා දිය හැකිවිය. මෙම අපරාධයෙන් ලබාගත් ලාභ මෙන්ම ඇයගේ සුඛෝපභෝගී ජීවන රටාවද සොයාගත හැකිවිය. මේවා අතර මෙල්බර්න් නුවර තට්ටු නිවාස තුනක් සහ නිවසක්, අවුඩි 6, මර්සඩීස් බෙන්ස් ඊ 500 සහ ග්‍රෑන්ඩ් ජීප් චෙරොකී ඇතුළු සුඛෝපභෝගී වාහන කිහිපයක් ඇතුලත්වේ. මෙම නඩුව සාර්ථකවීම සඳහා ප්‍රධානම හේතුව වූයේ හමුවුනු සේවාදායකයන් අනුව එක් එක් ගැහැණු ළමයා හට ගෙවිය යුතු මුදල් සම්බන්ධ ඇයගේ සටහන් ප්‍රතිනිර්මාණය කිරීම සහ ඕස්ට්‍රේලියානු නීතිය බලාත්මක කරන ඒජන්සි අතර තිබුණු සහයෝගීතාවයයි.

2013 කිම් මෙනෙවියව පොලීසිය මගින් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ඇයගේ සවුත්බෑන්ක් හි තිබුණු සුඛෝපභෝගී තට්ටු නිවාසයේ ලබාගත් ඡායාරූප මගින් සුවඳ විලවුන් බෝතල් පේළි විශාල ප්‍රමාණයක්, සුඛෝපභෝගී සපත්තු රාක්ක, ඩිසයිනර් අත්බෑග, සහ සේප්පු දෙකක් පෙනෙන්නට තිබුණි.

කිම් විසින් සිදුකල අපරාධයෙන් ලබාගත් මි $2.5 ක ලාභයෙන්, ඇය $202,000 ක් ප්‍රාඩා නිෂ්පාදන සඳහාද, $115,000 ක් ගුචි නිෂ්පාදන සඳහාද, $24,000 ක් හර්මීස් නිෂ්පාදන සඳහාද වියදම් කර ඇති බව මූල්‍ය විමර්ශකයන් විසින් පෙන්වා දිය හැකිවිය. තට්ටු නිවාස, නිවාසය, සහ කාරය ඇතුළු අපරාධය හේතුවෙන් ලබාගත් සියළු ලාභ සහ වත්කම් ඕස්ට්‍රේලියාවේ *2002 අපරාධවලින් ලබාගත් ලාභ පනත* යටතේ අවසාන වශයෙන් රාජසන්තක කරන ලදී.

6 වන කොටස: ජාත්‍යන්තර සහයෝගීතාවය

සටහන: මෙම විෂය සම්බන්ධයෙන් දැනටමත් ඇති තොරතුරු සැලකිල්ලට ගනිමින්, මෙම කොටස මගින් ජාත්‍යන්තර සහයෝගීතාවය පවත්වන ආකාරය සම්බන්ධ වැඩිදුර විස්තර ලබාදීමට අරමුණු නොකෙරේ. මෙහි අවධානය යොමුකර ඇත්තේ මූල්‍ය විමර්ශනයක් හට උපකාර කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතා ක්‍රමවේදය කොතරම් හොඳින් උපයෝගී කරගත යුතුද යන්න මතය.

6.1 ජාත්‍යන්තර සහයෝගීතාවය වැදගත් වන්නේ ඇයි?

ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යක්ෂම ජාත්‍යන්තර අපරාධ ක්‍රමවේදය අත්‍යාවශ්‍ය මෙවලම් වන අතර කාර්යක්ෂම මූල්‍ය විශුද්ධිකරණයට එරෙහි ක්‍රමවේදයක මූලික ලක්ෂණයක්වේ. මූල්‍ය විමර්ශන සඳහා උපකාර කිරීමට ජාත්‍යන්තර සහයෝගීතාව අවශ්‍යවීමට ඇති ප්‍රධාන හේතු වන්නේ:

- මූල්‍ය විමර්ශන සඳහා උපකාර ලබා ගැනීමට වෙනත් අධිකරණ බල සීමාවකින් **සාක්ෂි** ලබාගැනීම සඳහා, සහ
- **අපරාධයෙන් ලබාගත් ලාභ** සහ/හෝ **උපකරණ** හඳුනාගැනීමට, තහනම් කිරීමට, රාජසන්තක කිරීමට, සහ/හෝ වත්කම් යථා තත්වයට පත්කිරීම හෝ වන්දි ලබා දීමට.

6.2 මූල්‍ය විමර්ශණ සඳහා බහුලව උපයෝගී කරගනු ලබන ජාත්‍යන්තර සහයෝගීතා ආකාර

ජාත්‍යන්තර දේශසීමා හරහා තොරතුරු ලබා ගැනීම සඳහා සමාන තත්වයේ අය අතර සම්බන්ධතා ඇතිකර ගැනීම නිලධාරීන් හට ඉතා උපකාරී අවිධිමත් ක්‍රමවේදයකි. විධිමත් අන්‍යෝන්‍ය උපකාර සඳහා ඉල්ලීමක් කිරීමට ප්‍රථමයෙන් අවිධිමත් සහයෝගීතාවය ප්‍රතිලාභීවේ. අවිධිමත් සහයෝගීතා ක්‍රමවේද අතර පහත දේ ඇත:

- **ඒජන්සි සිට ඒජන්සි දක්වා ඇති මාර්ගය** (මෙයට පොලීසිය සිට පොලීසියට හෝ FIU සිට FIU ජාල වෙත යන්න ඇතුලත්වේ)
- **ඉන්ටර්පෝල් මාර්ගය** (මෙයට පුද්ගලයෙකු සොයා ගැනීම සඳහා දැන්වීමක් නිකුත් කිරීම ඇතුලත්වේ, මේ අනුව ඇය/ඔහු සම්බන්ධ මූල්‍ය ක්‍රියාකාරකම් සොයාගත හැකිය)
- **අවබෝධතා ප්‍රකාශය හෝ සමාන ගිවිසුම්,** සහ
- මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ වත්කම් නැවත ලබා ගැනීම සම්බන්ධ **අවිධිමත් ජාල**
  - මෙම අවිධිමත් ක්‍රමවේද අතරට ARIN-AP (ආසියා පැසිෆික් කලාපය සඳහාවූ වත්කම් නැවත ලබාගැනීම සඳහාවූ ජාලය), පොලීසියකින් පොලීසියකට (විදේශ පොලිස් සම්බන්ධීකරණ ස්ථාන/නීති තානාපතිවරුනි), සහ FIU සිට FIU වෙත ඇති ක්‍රමවේද (එග්මොන්ට් ආරක්ෂිත වෙබ් අඩවිය) වැනි වත්කම් නැවත ලබාගැනීමේ ජාල ඇත.

හෝඩුවාවන්

ඔබගේ රට තවම සාමාජිකත්වය ලබා නැතිනම්, ඔබගේ රටද ආසියා පැසිෆික් කලාපය සඳහාවූ වත්කම් නැවත ලබාගැනීම සඳහාවූ ජාලය (ARIN-AP) හා එක්වන ලෙසට උනන්දු කරන්න. ARIN-AP ජාලය මගින් සාමාජිකයන්ගේ උත්සාහයන් හට බහු ඒජන්සි මට්ටමින්, අපරාධකරුවන් විසින් ලබාගත් නීතිවිරෝධී ලාභ අහිමි කිරීම සඳහා උපකාර කරන වෘත්තිකයන්ගෙන් සමන්විත අවිධිමත් ජාලයකි.

ARIN-AP සාමාජිකත්වය ලබාගැනීම සම්බන්ධයෙන් වියදම් නොමැත. සාමාජිකත්වය සම්පූර්ණයෙන් ස්වේච්ඡාවෙන් වන අතර රටවල් හට තොරතුරු සැපයීම හෝ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට වගකීමක් නොමැත.

වැඩිදුර විස්තර **www.arin-ap.org/main.do** වෙබ් අඩවිය වෙතින් ලබාගත හැක.

අන්‍යෝන්‍ය නීති උපකාර යනු **වෙනත් අධිකරණ බල සීමාවකින් සාක්ෂි ලබා ගන්නා,** රාජ්‍යයන් අතරේ සහයෝගීතාවය ඇති ප්‍රධාන ආකාරයවේ. අන්‍යෝන්‍ය නීති උපකාර අවශ්‍ය වන්නේ අවිධිමත් ආකාරයට තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවලදීය. උදාහරණ වශයෙන්, බලපෑම් කිරීම් උපයෝගී කර ගැනීම, ලබා ගන්නා සාක්ෂි අධිකරණයේ භාවිතා කිරීමට බලාපොරොත්තුවීම, හෝ අනෙක් රටට අන්‍යෝන්‍ය නීති උපකාර ඉල්ලීමක් කලයුතු අවස්ථාවල.

උද්දර්පනය කලහැකි අපරාධයක් සම්බන්ධයෙන් අපරාධ නඩු විභාගයකට මුහුණදීම සඳහා හෝ අපරාධ සිරදඬුවමක් ගෙවීම සඳහා **අපරාධකරු සිය අධිකරණ බල ප්‍රදේශයට ගෙනඒම** සඳහා උද්දර්පනය කිරීම අවශ්‍ය විය හැකිවේ. වත්කම් සොයාගැනීම සම්බන්ධ මූල්‍ය විමර්ශනයකට උපකාර කිරීම සඳහාද උද්දර්පන ඉල්ලීමක් ප්‍රයෝජනවත් විය හැකිය. අනෙකුත් ජාත්‍යන්තර සහයෝගීතා අතර සිරදඬුවම් නියම කල සිරකරුවන් මාරුකර යැවීම, විශේෂ විමර්ශන ක්‍රම උපයෝගී කර ගනිමින් සිදු කරන සහයෝගීතාවය, සහ එක්ව කරන විමර්ශන ඇත.

6.3 සැලකිය යුතු වැදගත් කරුණු

ජාත්‍යන්තර සහයෝගීතාවය පවතින අතර ඔබගේ විමර්ශනයන් හට උපකාරී කිරීම සඳහා සැලකිය යුතු ප්‍රධාන කරුණු අතර පහත දේ ඇත:

- සාක්ෂි, වැරදිකරුවන්, ගොදුරුවූවන්, මිනිස් ජාවාරම් හේතුවෙන් ලබාගත් මුදල් වෙනත් රටවල ඇතිද යන්න තීරණය කිරීම සඳහා ප්‍රාථමික විමසීම් සඳහා වන අවිධිමත් ක්‍රමවේද උපයෝගී කර ගන්න.
- ඔබගේ විමර්ශනයේ මුල් අවස්ථාවල ඔබගේ ජාත්‍යන්තර සහයෝගීතාවය සම්බන්ධ මධ්‍යම අධිකාරිය, FIU, සහ අභිචෝදකයන් සමඟ සාකච්ඡා කරන්න, ඒ මගින් ඔබට ලබාගත හැකි විධිමත් සහ අවිධිමත් තොරතුරු මාර්ග මොනවාද යන්න අවබෝධ කරගත හැකිවේ.
- අනෙක් රටෙහි ඔබ හා සමාන මට්ටමට කටයුතු කරන අය සමඟ කල් ඇතිව සම්බන්ධතා ඇති කර ගන්න. මේ මගින් තොරතුරු ලබාගත හැක්කේ අවිධිමත් ජාල ඔස්සේද නැතිනම් අන්‍යෝන්‍ය නීති උපකාර ඉල්ලීම් කිරීමට අවශ්‍යද යන්න පැහැදිලි කරගත හැකිවේ. ඒ මගින් ඇතිවිය හැකි කිසියම් නෛතික ගැටළුවක් හඳුනා ගැනීමට උපකාර කරන අතර, අන්‍යෝන්‍ය නීති උපකාර ඉල්ලීම් සම්බන්ධ අවශ්‍යතාවය පැහැදිලි කර ගැනීමට උපකාරවේ.
- අන්‍යෝන්‍ය නීති උපකාර ඉල්ලීම් අවශ්‍ය නම්:
  - ඔබ තොරතුරු ඉල්ලා සිටින රටේ ඇති අවශ්‍යතාවයන් පැහැදිලි කර ගන්න.
  - ඔබ ලබා ගැනීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කර ගන්න, මෙය ලබා ගැනීමට ඔබ අනුගමනය කරන පියවර සකසා ගන්න.
    - මේවා අතරට වත්කම් හඳුනා ගැනීම, ප්‍රතිලාභී අයිතිය ස්ථාපනය කිරීම, සාධනීය අපරාධය ඔප්පු කිරීම, සීමා කිරීම් ඉල්ලා සිටීම, දේපළ අත්පපත් කර නැවත සිය රටට ගෙන ඒම ඇත.
  - ඔබගේ ඉල්ලීමේ සියළුම දේ, එනම්, තොරතුරු සහ අදාල රට විසින් ඉල්ලන සියළුම ලියකියවිලි, ඇතුලත් බවට වග බලා ගන්න.
  - සාක්ෂි ලබාගත යුතු ආකාරය සම්බන්ධයෙන් පැහැදිළි කර ගන්න.
  - ඔබගේ ඉල්ලීමට අනුව කටයුතු කිරීම සඳහා නියම කාලසීමා ලබා දෙන්න (ලැබෙන අය සමඟ කල් ඇතිව සාකච්ඡා කරගන්න).
  - ඔබ විදේශ රටක ලියාපදිංචිකල වාරණ හෝ අත්පත් කර ගැනීමේ නියෝගයක් ඉල්ලා සිටින්නේ නම්, ඔබ ඉල්ලා සිටින නියෝගය විදේශ රාජ්‍යයෙහි නීති පද්ධතියේ අවශ්‍යතාවලට අනුකූල බවට වග බලා ගන්න.
- අදාල විදේශ රටෙහි රාජසන්තක කිරීම සහ අත්පත් කර ගැනීම සම්බන්ධ රාමුව සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටින්න, එසේම රාජසන්තක කල දේපළ ඔබ වෙත එවීමේ හැකියාව සොයා බලන්න.

මිනිස් ජාවාරම් පිළිබඳ මූල්‍ය විමර්ශන කටයුත්තක් සම්බන්ධ උදාහරණ:

මිනිස් ජාවාරම්වලට සම්බන්ධවුණු වරදකරුවෙක් හට නඩු පැවරීමට අවශ්‍ය බැංකු වාර්තා විදේශ රටක ඇති බවට පොලීසිය සැක කරයි.

අවිධිමත් සහයෝගීතාවයට පහත දේ තිබිය හැකිය:
අදාල රටෙහි පොලීසිය විදේශ රටෙහි පොලීසිය හා සම්බන්ධවී ප්‍රශ්නගත බැංකු වාර්තා ඇතිද යන්න සනාථ කර ගැනීම.

බැංකු වාර්තා ඇති බවට පොලීසිය සනාථ කරන අතර වරදකරු හට චෝදනා ඉදිරිපත් කරයි.

විධිමත් සහයෝගීතාවය අතරට පහත දේ ඇත:
වරදකරු විසින් අදාල බැංකු වාර්තාවලට තමාගේ කිසිදු සම්බන්ධතාවයක් නැති බව පවසයි. මේ අනුව අභිචෝදකයන් හට මෙම වාර්තා අධිකරණ කටයුත්තකදී පිළිගත හැකි ආකාරයට ලබගැනීම අවශ්‍යවේ.

රජය මගින් පිළිගත හැකි ආකාරයේ බැංකු වාර්තා ලබාදෙන ලෙසට අන්‍යෝන්‍ය නීති උපකාර ඉල්ලීමක් යටතේ අදාල රජය වෙත යොමු කරයි.

විදේශ රජය මගින් එම වාර්තා පිළිගත හැකි ආකාරයට ලබාදේ.

හෝඩුවාවන්

විමර්ශනයක මුල් අවස්ථාවල ඔබගේ මධ්‍යම අධිකාරිය, අභිචෝදකයන් සහ ඔබගේ FIU හා සම්බන්ධ වන්න.

හෝඩුවාවන්

තොරතුරු සඳහා ප්‍රවේශ වීමට, තිබිය හැකි තොරතුරු ආකාර පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා ගැනීමට, අවශ්‍ය අමතර තොරතුරු ලබාගත හැකි හොඳම ආකාරය සොයා ගැනීමට, සහ තොරතුරු සඳහා වන ඕනෑම විධිමත් ඉල්ලීමක් වඩා හොඳින් ඉලක්ක කිරීම සඳහා අවිධිමත් තොරතුරු බෙදා හදා ගැනීමේ මාර්ග විමර්ශනයේ **මුල් අවධියේදී** උපයෝගී කර ගන්න.

7 වන කොටස: නව ගෙවීම් ක්‍රමවේද

නව තාක්‍ෂණයන් මගින් ලොව පුරා සිදු කරන ගෙවීම් වඩා ලාභදායී සහ කාර්යක්‍ෂමතාවයෙන් කිරීමේ හැකියාව ලබාදේ. මෙම උන්නතිය මගින් සම්ප්‍රදායික මුදල් නොගෙවන ගෙවීමේ ක්‍රම සමග සන්සන්දනයේදී ඇති වඩා වැඩි නිර්නාමිකත්වය ඇතුළු මුදල් විශුද්ධිකරණ අවධානම්ද ඇති කෙරේ. නව තාක්‍ෂණය භාවිතයෙන් කරන ගනුදෙනු සාමාන්‍යයෙන් නියාමනය කල මූල්‍ය පද්ධතියෙන් පරිබාහිරව සිදුවේ, එසේම රටවල් ගණනාවක් ඔස්සේ සිදුවිය හැකි අතර, විවිධ මට්ටමේ අනවධානයන්ට යටත්විය හැකිය. මෙම හේතු නිසා, ප්‍රතිපත්ති සම්පාදනය කරන අය සහ විමර්ශකයන් විසින් එවා ක්‍රියාත්මක වන ආකාරය සහ අපරාධකරුවන් විසින් එවා උපයෝගී කරගත හැකි ආකාරය සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටිය යුතුය. නව තාක්‍ෂණයන් උපයෝගී කරගනිමින් සිදු කරන බහුල ගෙවීම් ක්‍රම අතර පහත දේ ඇත:

ස්මාර්ට් කාඩ්පත් (මුදල් තැන්පත් කර ඇති වටිනාකම සහිත කාඩ්පත්)
ක්‍රෙඩිට් කාඩ්පතක ආකාරයට පෙනෙන මයික්‍රොචිපයක් ඇති ප්ලාස්ටික් කාඩ්පතකි. බැංකු ගිණුමකට සම්බන්ධ නොවන ආකාරයට ගෙවීමක් සිදුකල හැකිය. උදාහරණ වශයෙන්, උපරිම මුදලක් එකතු කල හැකි, අගය එකතු කල හැකි, කලින් ගෙවිය හැකි කාඩ්පතක්. මෙය ඒ.ටී.එම්. (ATM) වෙතින් මුදල් ආපසු ගැනීමට සහ සමහර මාර්ගගත සහ කඩසාප්පුවල මිලට ගැනීම් කල හැකි අතර බැංකු ගිණුමකට සම්බන්ධවී නැත.

PayPal ගෙවීම්
පාරිභෝගිකයන් හට ක්‍රෙඩිට් හෝ ඩෙබිට් ආකාරයට, බැංකු ගිණුම්/හෝ PayPal ගිණුම් වලට වෙනත් PayPal භාවිතා කරන අය විසින් මාර්ගගතව, මෝබයිල් උපකරණ හෝ සාප්පු තුල (සමහර රටවල) මුදල් යැවීමට හෝ ලබා ගැනීමට හැකි මාර්ගගත ඩිජිටල් පසුම්බියකි.

ක්‍රිප්ටොකරන්සි (උදා. බිට්කොයින්)
බැංකු ක්‍රමයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන, වර්චුවල් මුදල් වර්ගයකි. භාවිතා කරන අය සිය අනන්‍යතා තොරතුරු හුවමාරු නොකර ගනිමින් ගනුදෙනු සිදු කෙරේ. මේ මගින් සංකීර්ණ ආරක්‍ෂිත කේත භාවිතයෙන් නිර්නාමිකව ගනුදෙනු කල හැකිවේ. මුදල් නිර්මාණය කරන හෝ ගනුදෙනු සනාථ කරන මධ්‍යම අධිකාරියක් නැත.

ජංගම දුරකථන මගින් කෙරෙන ගෙවීම්
ජංගම දුරකථන ගෙවීම්වලදී විදුලි සංදේශ ක්‍රියාකරුවෙකු ගෙවීම්වල අතරමැදියා වශයෙන් කටයුතු කර, මුදල් නිදහස් කිරීමට සහ ගෙවීම් කිරීමට කටයුතු කරයි. සාම්ප්‍රදායික බැංකු සේවාවලට ප්‍රවේශය නැතිවිට හෝ එම සේවා සීමාවන අවස්ථාවල මේවා බහුලව භාවිතාවේ. මෙම ගෙවීම්වලදී යවන ලද මුදල් ප්‍රමාණය දුරකථන ගිණුමට එකතු කිරීම හෝ දුරකථන ගිණුමට කලින් ගෙවා තිබිය හැකිය, නැතිනම්, වටිනාකම SIM කාඩ්පතේ තැන්පත්කර තබනු ඇත. ජංගම දුරකථන සහ ස්මාර්ට් උපකරණවල තාක්‍ෂණයේ උන්නතිය හේතුවෙන් කාඩ්පතක් හෝ සම්ප්‍රදායික බැංකු මගින් මුදල් යැවීම නොකර ගුවන්විදුලි තරංග හඳුනාගැනීම (RFID), සමීප ක්ෂේත්‍ර සන්නිවේදනය (NFC) හෝ ඒ හා සමාන තාක්‍ෂණය උපයෝගී කරගෙන මෙම උපකරණ භාවිතයෙන් ගෙවීම් සිදුකල හැකිය.

ඉන්ටර්නෙට් බැංකු සහ ගෙවීමේ විකල්ප
ඉන්ටර්නෙට් හි උන්නතිය හේතුවෙන් ඉන්ටර්නෙට් පමණක්ම භාවිතා කර බැංකු ගිණුමකට හෝ බැංකු ගිණුමක සිට මුදල් හුවමාරු කිරීම හෝ බැංකු නොවන ආයතන මගින් සපයන ගෙවීම් සේවා මත යැපීම වැඩිපුර සිදුවේ. මෙම සේවා හේතුවෙන් පාරිභෝගිකයන් සම්බන්ධ නිසි සැලකිල්ල (CDD) සහ ඔබගේ පාරිභෝගිකයා සම්බන්ධයෙන් දැනගැනීම (KYC) මනා ලෙස අනුගමනය නොකරන රටවල්වල පරිගණක හෝ ස්මාර්ට් උපකරණ භාවිතයෙන් ගෙවීම් කිරීම ස්ථාපනය කිරීම මගින් අවධානම වැඩිවී ඇත.

හෝඩුවාවන්

මුදල් යැවීම සඳහා ඇති නවීන තාක්‍ෂණයන් සම්බන්ධයෙන් දැනුවත්වී සිටින්න. මෙම ගෙවීම් ක්‍රම විමර්ශනය කිරීමේදී ඔබගේ FIU හා සම්බන්ධ වන්න.

8 වන කොටස: හෝඩුවාවල සාරාංශය

- මුදල් විශුද්ධිකරණයට එරෙහි පුළුල් නීති ස්ථාපනය කරන්න.
- මුදල් විශුද්ධිකරණ සහ සාධනීය අපරාධ වැරදි සම්බන්ධයෙන් වෙන වෙනමම නඩු පවරන බවට වග බලා ගන්න.
- වරදකාරිත්වයෙන් තොර අහිමිකිරීම් ස්ථාපනය කරන්න.
- මිනිස් ජාවාරම ඇතුළු මුල්‍යමය ප්‍රතිලාභ ඇති අපරාධ සම්බන්ධයෙන් නීතිය බලාත්මක කරන විමසීම් කරන විට සමගාමී මුල්‍ය විමර්ශන සිදු කිරීමට සක්‍රීය ක්‍රියා මාර්ග ගැනීම නිතිපතා කරන්නක් වන බවට වගබලා ගන්න.
- නැවත සොයාගත් වත්කම් සම්බන්ධ සංඛ්‍යාලේඛණ රැස් කරගන්න, එසේම, මිනිස් ජාවාරම් ජාල අඩපණ කිරීම සඳහා මුදල් විශුද්ධිකරණ අපරාධ වැරදි උපයෝගී කරගන්න. මිනිස් ජාවාරම් සම්බන්ධ ඔබගේ රාජ්‍යයේ ප්‍රතිචාර සම්බන්ධයෙන් මෙම කාර්ය සාධන දර්ශක උපයෝගී කර ගැනීමට සලකා බලන්න.
- ඔබගේ සංවිධානයේ සියළුම මට්ටම්වල මුදල් ලුහුබැඳයාමේ ප්‍රවේශය අනුගමනය කිරීමට ඉහළ මට්ටමින් උපකාර කිරීමට උනන්දු කරන්න.
- ඔබගේ දේශීය රාමුවේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධ නඩුකටයුතුවලදී පුළුල් පරාසයක අන්‍යෝන්‍ය නීති උපකාර ඇති බවට සහ ඔබගේ දේශීය නීතියේ මුදල් විශුද්ධිකරණය උද්දර්පනය කලහැකි වරදක් වන බවට වග බලා ගන්න.
- අපරාධ වැරදි පූර්ණ වශයෙන් විමර්ශනය කරන බවට වග බලා ගැනීම සඳහා ඔබගේ ප්‍රතිචාරය සඳහා සියළුම ඒජන්සිවල විශේෂඥයන් එක කරන බවට වග බලා ගන්න (විමර්ශකයන්, FIU, සහ අභිචෝදකයන්).
- ඔබගේ විමර්ශන ඔස්සේ ඔබ ලබාගත් මුදල් තොරතුරු පසුපස යාම සඳහා නඩු කටයුතු කළමණාකරණ ක්‍රමවේදයක් උපයෝගී කර ගන්න.
- ඔබට තොරතුරු (උදා. මානව හිමිකම්, පුද්ගලිකතාව, දත්ත ආරක්ෂා කිරීම, සහ රහස්‍යබව සම්බන්ධ අවශ්‍යතා) ලබාගැනීම සඳහා ඔබ විසින් ක්‍රියාත්මක විය යුතු නීතියේ අවශ්‍යතා සලකා බැලූ බවට සහතික වන්න.
- ඔබගේ විමර්ශනයේ මුල් අවස්ථාවල අවිධිමත් තොරතුරු හුවමාරු කර ගැනීම් උපයෝගී කර ගන්න. මූල්‍ය තොරතුරු බෙදාහදා ගන්නා ජාල උපයෝගී කර ගන්න. වත්කම් නැවත ලබා ගැනීම සඳහාවූ අන්තර් ඒජන්සි ජාලය ආසියා පැසිෆික් (ARIN-AP) හි සාමාජිකත්වය දැනටමත් ලබාගෙන නැතිනම්, ඔබගේ රටට එහි සාමාජිකත්වය ලබා ගන්නා ලෙස උනන්දු කරන්න.
- ඔබගේ විමර්ශනයේ මුල් අවස්ථාවල ඔබගේ FIU සහ මධ්‍යම අධිකාරිය හා සම්බන්ධ වන්න.
- මුදල් යැවීම සඳහා ඇති නව තාක්‍ෂණික ක්‍රම සම්බන්ධයෙන් දැනුවත්ව සිටින්න. මෙම ගෙවීමේ ක්‍රම විමර්ශනය සම්බන්ධ උපදෙස් සඳහා ඔබගේ FIU හා සම්බන්ධ වන්න.

බාලි ක්‍රියාවලිය

මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ

බාලි ක්‍රියාවලිය